උක් පර්යේෂණ ආයතනය

ප්‍රධාන පර්යේෂණ මධ්‍යස්ථානය

උඩවලව, ශ්‍රී ලංකාව

දුරකථන +94472233281, +94472233285, ෆැක්ස් +94472233233

විද්‍යුත් තැපෑල info@sugarres.lk වෙබ් අඩවිය www.sugarres.lk

කොළඹ කාර්යාලය

අංක 21 ඒ, පාලාවත්ත පාර, තලංගම (දකුණ)

දුරකථන +944114389152, ෆැක්ස් +94112785796

සභාපති

දුරකථන +944114389150, ෆැක්ස් +94112785796

අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී

දුරකථන +94474937335, ෆැක්ස් +94472233282

ගරු අමාත්‍යතුමා,
උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැට්,
බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය,
ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය,
16වන මහල, සුහුරුපාය,
බත්තරමුල්ල.

2020.03.01

ගරු ඇමතිතුමනි,

2019.01.01 සිට 2019.12.31 දක්වා කාලය සඳහා
උක් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව

2019.01.01 සිට 2019.12.31 දක්වා කාලය සඳහා උක් පර්යේෂණ ආයතනයේ ප්‍රගතිය, එම මුදල් වර්ෂය වෙනුවෙන් වූ අවසන් ගිණුම් හා විගනකාධිපතිගේ වාර්තාව ද අඩංගුකොට ඉහත වාර්ෂික වාර්තාව සමග ඉදිරිපත් කරමි.

මෙයට
විශ්වාසී වූ

උක් පර්යේෂණ ආයතනය

ආචාර්ය. එන්. සී. කුමාරසිංහ
සභාපති
පාලක මණ්ඩලය

පටුන

	පිටු අංකය
දැක්ම	01
මෙහෙවර	01
පාලක මණ්ඩලය	02
සභාපතිගේ සමාලෝචනය	03
අධ්‍යක්ෂකගේ සමාලෝචනය	05
අංශික වාර්තා	10
බෝග වැඩිදියුණු කිරීමේ අංශය	12
බෝග හා සම්පත් කළමණාකරණ අංශය	16
බෝග පෝෂණ අංශය	20
බෝග ආරක්ෂණ අංශය	24
යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශය	30
සැකසුම් තාක්ෂණ අංශය	34
ආර්ථික විද්‍යා, පෛවම්තික සහ තොරතුරු තාක්ෂණ අංශය	38
තාක්ෂණ සම්ප්‍රේෂණ සහ සංවර්ධන අංශය	42
ප්‍රකාශන	48
පරිපාලන සහ මුදල් අංශය	52
විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව	58
විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන	60
විගණකාධිපති වාර්තාව	72
2013 සිට **2018** දක්වා ප්‍රධාන මූල්‍ය තොරතුරු	83

දැක්ම

ශ්‍රී ලංකාවේ උක් කර්මාන්ත තාක්ෂණයන් සම්බන්ධ විශිෂ්ටතම ආයතනය සහ එම කර්මාන්තය දියුණු කිරීමේ ප්‍රමුඛයා වීම

මෙහෙවර

ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තයෙහි තරහකාරීත්වය ඉහළ නැංවීම සහ එය වඩාත් පුළුල්කර චිරස්ථායී ලෙස සංවර්ධනය කිරීමට දායකත්වය ලබාදීම සඳහා සුදුසු තාක්ෂණයන් නිපදවීම සහ ප්‍රචාරණය කිරීම

පාලක මණ්ඩලය

කේ. ප්‍රේමරත්න මහතා	- පත්කළ සාමාජික (සභාපති) **2019.01.30** දක්වා
කේ. ඒ. එෆ්. කරුණාසේන මහතා	- පත්කළ සාමාජික (සභාපති) **2019.01.31** සිට
ඇන්. වී. ටී. ඒ. වේරගොඩ මහතා	- පත්කළ සාමාජික
මහාචාර්ය ඒ. එල්. ටී. පෙරේරා	- පත්කළ සාමාජික
එම්. ආර්. වී. ආර්. මීපුර මහතා	- මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ නියෝජිත **2019.01.07** දක්වා
හේමන්තා පුබුදුසිරි මීය	- මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ නියෝජිත **2019.02.08** සිට
එස්. එන්. අත්තනායක මීය	- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ නියෝජිත
ආචාර්ය ඒ. පී. කීර්තිපාල	- අධ්‍යක්ෂ (නිල බලයෙන් පත්වන සාමාජික) **2019** ජූලි 13 දක්වා

සභාපතිගේ සමාලෝචනය

උක් පර්යේෂණ ආයතනයේ 2019 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 406.5ක් වෙන් කර තිබුණි. එහි ඒකාබද්ධ අරමුදලෙන් ලැබුණු රුපියල් මිලියන 336.5ක් සහ ආයතනය විසින් ජනනය කරන ලද අරමුදල්වලින් රුපියල් මිලියන 70ක් අන්තර්ගත විය. පුනරාවර්තන වියදම් සඳහා මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 280ක් විය. ඒකාබද්ධ අරමුදලෙන් රුපියල් මිලියන 260ක් සහ ආයතනය විසින් ජනනය කරන ලද අරමුදල්වලින් රුපියල් මිලියන 20ක් ඒ අතර විය. ප්‍රාග්ධන වියදම් සඳහා මුළු ප්‍රතිපාදන රුපියල් මිලියන 126.5ක් විය; එහි ඒකාබද්ධ අරමුදලෙන් රුපියල් මිලියන 76.5ක් සහ ආයතනය විසින් ජනනය කරන ලද අරමුදල්වලින් රුපියල් මිලියන 50ක් ඇතුළත් විය. කෙසේ වෙතත්, 2019 වර්ෂය තුළ දී ආයතනයට භාණ්ඩාගාරයෙන් ලැබුණේ රුපියල් මිලියන 268.257ක් පමණි. එය පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 238.957කින් සහ ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 37.3කින් සමන්විත විය. මේ අනුව ඒකාබද්ධ අරමුදලින් වෙන් කළ රුපියල් මිලියන 68.243ක් ලැබී නැත. පුනරාවර්තන වියදම් සඳහා වෙන් කරන ලද අරමුදල්වලින් 91.9%කට ආසන්න ප්‍රමාණයක් ලැබුණ ද, ප්‍රාග්ධන වැඩ සඳහා වෙන් කළ මුදලින් ලැබුණේ 48.8%ක් පමණි. මෙය ආයතනයේ කාර්යසාධනයට, විශේෂයෙන් ආයතනයේ සංවර්ධන කටයුතුවලට සැලකිය යුතු ලෙස බලපා ඇත.

ආයතනය විසින් සිදු කරන ලද පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්වල කැපී පෙනෙන ජයග්‍රහණ අතරට උක් හා සීනි අස්වැන්න සහ රෝග සහ පලිබෝධවලට ප්‍රතිරෝධීබව යන ලක්ෂණවලට අදාළ බලාපොරොත්තු තැබිය හැකි උක් ප්‍රභේද හඳුනා ගැනීම; එස්. එල්. 2008 ශ්‍රේණියේ ප්‍රභේද 22ක්, එස්. එල්. 2007 ශ්‍රේණියේ ප්‍රභේද 24ක්, 2006 ශ්‍රේණියේ ප්‍රභේද 23ක්, 2005 ශ්‍රේණියේ ප්‍රභේද 25ක්, 2004 ශ්‍රේණියේ ප්‍රභේද 54ක්, 2003 ශ්‍රේණියේ ප්‍රභේද 14ක් සහ 2002 ශ්‍රේණියේ ප්‍රභේද 26ක් ඒ අතර විය. අමතරව සුදු පත්‍ර රෝගය ඇති පරිසරයේ වගා කිරීම සඳහා සුදුසු ප්‍රභේදයක් ලෙස එස්. එල්. **92 5588** හඳුනා ගැනීම, එලදායී නව වල් නාශක හඳුනා ගැනීම, එනම් පශ්චාත් නිර්ගමන අවධියේ දී උක්වල වල් පැළෑටි පාලනය කිරීම සඳහා ග්ලූෆොසිනේට් ඇමෝනියම් 280 ග්‍රෑම් /එල් එස්.එල් භාවිතා කළහැකි බව, උක් වගා කරන ලද පස් වැඩිදියුණු කිරීම සඳහා කාබනික පොහොර විශේෂ ලෙස මුං ඇට (*Vigna radiata*) සහ සන්හෙම්ප් (*Crotalaria juncea*) සුදුසු යැයි හඳුනා ගැනීම, සෙවනගල ප්‍රදේශයේ උක් වගාකරන පස් සඳහා සෘජුවම විනෑස් හා පෙරහන් මඩ යෙදීම සඳහා නිර්දේශ ලබා දීම, ආනවිලුන්දන් හි හකුරු සැකසුම් ඒකකය පිහිටුවීම සම්පූර්ණ කිරීම, උපකරණ සැපයීම සහ කිලිනොච්චි ප්‍රදේශයේ ආනවිලුන්තන් හි ගොවි බිම් අක්කර 15ක උක් වගාවන් 45ක් ස්ථාපිත කිරීම සිදුකරන ලදී.

දැනුම බෙදා හැරීමේ කටයුතුවලට අදාළව ගොවීන් 1,130ක් සහ ක්ෂේත්‍ර නිලධාරීන් 376 දෙනෙකු නව උක් නාක්ෂණයන් පිළිබඳව පුහුණුකර ඇති අතර, ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් / ක්ෂේත්‍ර ආදර්ශන 40ක් සහ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 13ක් සිදුකර ඇත. අමතරව උක් වගා සහ සීනි කම්හල් ප්‍රදේශවල ක්ෂේත්‍ර ආදර්ශන ස්ථාන 88ක් ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම, බදුල්ල, කිලිනොච්චි සහ නුවරඑලිය දිස්ත්‍රික්කවල කුඩා පරිමාණයේ උක් කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා තවාන් පිහිටුවීම හා ගොවීන් පුහුණු කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. අදාළ සීනි සමාගම් සමග එක්ව සෙවනගල, පැල්වත්ත සහ හිඟුරාන යන ප්‍රදේශවල දැනට පවතින රෝග ආසාදිත උක් තවාන් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ආරම්භ කරන ලද වැඩසටහන ද අඛණ්ඩව සිදු කෙරිණි. සුදු පත්‍ර රෝග පාලන වැඩසටහන යටතේ සීනි කර්මාන්ත අතර බෙදා හැරීම සඳහා ග්ලයිෆොසේට් ලීටර් 31,815ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට උක් පර්යේෂණ ආයතනය සමත් විය.

ශ්‍රී ලංකා උක් පර්යේෂණ ආයතනය සඳහා මාළඹේ ප්‍රදේශයේ කාර්යාල පරිශ්‍රයක් අත්පත් කර ගැනීම මගින් කොළඹ කාර්යාලය ස්ථිර හා පහසු ස්ථානයක ක්‍රියාත්මක කිරීමේ දිගු කාලීන අවශ්‍යතාවය සපුරාලීය. පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ උඩවලවේ ප්‍රධාන පර්යේෂණ ඒකකය, සියඹලාණ්ඩුවේ ව්‍යාධි ගොවිපල, හන්තානේ නිරෝධායන ස්ථානය, එන්ඝල්වත්තේ අභිජනන ස්ථානය සහ කන්තලේ උප මධ්‍යස්ථානය යන ස්ථානයන්හි කාර්ය මණ්ඩලයට පහසුකම් සැපයීම සඳහා ආයතනය අඛණ්ඩව කටයුතු කළේය. කාර්ය මණ්ඩලය ශක්තිමත් කිරීම සඳහා නියෝජ්‍ය

අධ්‍යක්ෂවරයකු (පර්යේෂණ), නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු (පරිපාලන), පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකු, එක් සංවර්ධන නිලධාරියෙකු, කාර්මික නිලධාරීන් තිදෙනෙකු, කළමනාකරණ සහකාර (ගිණුම්) සහ සාමාන්‍ය සේවකයින් තිදෙනෙකු බඳවා ගන්නා ලදී. පර්යේෂණ, තාක්ෂණික හා සහාය කටයුතු සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය වැඩි කිරීම සඳහා ආයතනයේ සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කරන ලදී. කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය සඳහා අදාළ කාර්ය මණ්ඩලයට දිගු කාලීන හා කෙටි කාලීන පුහුණු අවස්ථා ලබා දී ඇත. මීට පෙර මුදා හරින ලද පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකුගේ පශ්චාත් උපාධිය හැදෑරීම අඛණ්ඩව පවත්වාගෙන යාමට අමතරව, තවත් එක් පර්යේෂණ නිලධාරියෙකු ආචාර්ය උපාධිය ලබා ගැනීම සඳහා නිදහස් කරන ලදී. වැඩ අධිකාරීට සහ ගණකාධිකාරීට ආයතනයේ ඔවුන්ගේ වැඩවලට අදාළ විෂයන් පිළිබඳව විදේශයන්හි පුහුණුව ලබා දෙන ලදී. විවිධ අංශවල කාර්ය මණ්ඩලයද ඔවුන්ගේ රැකියා ක්ෂේත්‍රයන්හි දේශීයව පුහුණු කරන ලදී.

තවද, පසුගිය වසරේ ආරම්භ කරන ලද උක් පර්යේෂණ ආයතන පනත සංශෝධනය කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කෙරිණි.

ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා පාකිස්තානයේ උක් පර්යේෂණ ආයතනය සහ චීනයේ යුනාන් කෘෂිකාර්මික විද්‍යා ඇකඩමිය සමග සහයෝගයෙන් කටයුතු කිරීමට කටයුතු සම්පාදනය කරන ලදී.

ආයතනයේ කාර්යසාධනය සඳහා ඇති ප්‍රධාන බාධක නම්, නියමිත වේලාවට මුදල් නොලැබීම, පුහුණු කාර්ය මණ්ඩලයේ හිහකම, විශේෂයෙන් විද්‍යාත්මක හා ඉහළ කළමනාකරණ තනතුරු සඳහා සහ ඉහළ මට්ටමේ කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමේ හා රඳවා ගැනීමේ දුෂ්කරතා ය.

K. Karunasena.

කේ. ඒ. එෆ්. කරුණාසේන
සභාපති
උක් පර්යේෂණ ආයතනය

අධ්‍යක්ෂගේ සමාලෝචනය

උක් පර්යේෂණ ආයතනය 2019 වසරේ දී ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා උක් කර්මාන්තය පිළිබඳ නව දැනුම / තාක්ෂණයන් ජනනය කිරීම සඳහා පර්යේෂණ පැවැත්වීම, සීනි සමාගම්, ගොවීන් සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන්ට තාක්ෂණික දැනුම බෙදා හැරීම, කුඩා පරිමාණ සැකසුම් කර්මාන්ත සඳහා අත්තිවාරම් බීජ සැපයීම සහ උක් වගාව පුළුල් කිරීම මගින් දායක විය. උක් බෝග වැඩිදියුණු කිරීම, බෝග හා සම්පත් කළමනාකරණය, බෝග පෝෂණය, බෝග ආරක්ෂණය, ගොවිපල යාන්ත්‍රිකකරණය සහ සැකසුම් හා නිෂ්පාදන සංවර්ධනය යන කරුණු වලින් සමන්විත දිගුකාලීන පර්යේෂණ වැඩසටහනක් රටේ උක් කර්මාන්ත සංවර්ධනයේ අවශ්‍යතා සපුරාලීම සඳහා තාක්ෂණික දැනුම වර්ධනය කිරීම අරමුණු කර ගෙන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. පර්යේෂණ වැඩසටහන මගින් ජනනය කරන ලද දැනුම / තාක්ෂණයන් සීනි සමාගම්, ගොවීන් සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන් වෙත බෙදා හැරීම සඳහා තාක්ෂණ හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ආයතනය විසින් නිර්දේශ කරන ලද නව උක් ප්‍රභේදවල අත්තිවාරම් බීජ නිෂ්පාදනය කිරීම, සීනි කම්හල් නොමැති ප්‍රදේශවල කුඩා පරිමාණ සැකසුම් කර්මාන්ත සඳහා උක් වගාව පුළුල් කිරීම සහ උක් වගාවේ සුදු පත්‍ර රෝග පාලනය කිරීමේ වැඩසටහනක් ද ඇතුළත් සංවර්ධන වැඩසටහන් තවදුරටත් සිදුකරන ලදී.

වාණිජ වගාව සඳහා 2019 වර්ෂය තුළ නව උක් ප්‍රභේද නිකුත් නොකළද, බලාපොරොත්තු තැබිය හැකි ප්‍රභේද හඳුනා ගන්නා ලදී; එස්. එල්. 2008 ශ්‍රේණියේ ප්‍රභේද 22ක්, එස්. එල්. 2007 ශ්‍රේණියේ ප්‍රභේද 24ක්, 2006 ශ්‍රේණියේ ප්‍රභේද 23ක්, 2005 ශ්‍රේණියේ ප්‍රභේද 25ක්, 2004 ශ්‍රේණියේ ප්‍රභේද 54ක්, 2003 ශ්‍රේණියේ ප්‍රභේද 14ක් සහ 2002 මාලාවෙන් ප්‍රභේද 26ක් ඒ අතර විය. ආනයනය කරන ලද උක් ප්‍රභේද 29ක් (වියට්නාම් ප්‍රභේද 20ක් සහ චීන ප්‍රභේද 9ක්) නිරෝධායනය කරන ලදී. එස්. එල්. 86 13 සහ එස්. එල්. 92 5588 යන ප්‍රභේද සුදු පත්‍ර රෝගය ඇති පරිසරයේ වගා කිරීම සඳහා සුදුසු ප්‍රභේද ලෙස හඳුනාගෙන ඇත. 2019 වසරේ බෝග අභිජනන සමය තුළ අභිජනන 1,238 ක් සිදුකරන ලදී. ඉන්දියානු සහ ඉරාන උක් ස්ට්‍රික් මොසෙයික් වෛරස් ප්‍රභේද දේශීයව එකතු කරන ලද උක් ප්‍රභේදයන්ගෙන් හඳුනාගෙන ඇති අතර, අනුක්‍රමික දත්ත SRI-SL1 ලෙස ජාන බැංකුව වෙත ඉදිරිපත් කරන ලදී.

උක් බෝග හා සම්පත් කළමනාකරණය යටතේ ග්ලූෆොසිනේට් ඇමෝනියම් 280 ග්‍රෑම් / ලීටර් ශ්‍රී ලංකාවේ උක් වගාවල පශ්චාත් නිර්ගමන මුල් අවධියේ දී වල් පැළෑටි පාලනය කිරීම සඳහා නව වල් නාශකයක් ලෙස ඵලදායී බව හඳුනා ගන්නා ලදී. ටෙම්බොට්‍රියෝන්, උක්වල පූර්ව නිර්ගමන අවධියේදී වල් පැළෑටි පාලනය කිරීම සඳහා ඵලදායී නව වල් නාශකයක් ලෙස හඳුනාගෙන ඇත. බෝග වයසට එදිරිව සී. ඕ. 775, එස්. එල්. 71 30, එස්. එල්. 83 06, එස්. එල්. 88 116, එස්. එල්. 90 6237, එස්. එල්. 92 4918, එස්. එල්. 96 128 සහ එස්. එල්. 96 328 යන ප්‍රභේදවල පොල්% වෙනස්වන ආකාරය ලංකා සීනි පුද්ගලික සමාගම, සෙවනගල සමග එක්ව හඳුනාගෙන ඇත. උක් වගා කළ පස් වැඩිදියුණු කිරීම සඳහා මුං ඇට (*Vigna radiata*) සහ සන්හෙම්ප් (*Crotalaria juncea*) හොඳ හරිත පොහොර විශේෂයන් ලෙස හඳුනා ගන්නා ලදී. උක් වගාවේ පිරිවැය සහ ප්‍රතිලාභ මෙන්ම උක් වගාකරන ප්‍රදේශවල ඇති තරහකාරී බෝගවල පිරිවැය සහ ප්‍රතිලාභ දත්තයන් ද යාවත්කාලීන කරන ලදී.

සෙවනගල ප්‍රදේශයෙහි උක් වගාකරන පස් සඳහා සෘජුවම විනෑස් සහ පෙරහන් මඩ යෙදීම සඳහා නිර්දේශ ලබා දෙන ලදී. මීට අමතරව, සෙවනගල සහ පැල්වත්ත ප්‍රදේශ සඳහා ලබා දී ඇති පොහොර නිර්දේශ සංශෝධනය කිරීම සඳහා සවිස්තරාත්මක විශ්ලේෂණ අඛණ්ඩව සිදු කරන ලදී.

උක් බෝග ආරක්ෂාව යටතේ සුදු පත්‍ර රෝගය සහ උක් වගාවේ කඳ පණුවන් පාලනය කිරීම සඳහා ඉහළම ප්‍රමුඛතාවය ලබා දෙන ලදී. වාණිජ උක් වගාවන්හි රෝග හා පළිබෝධ තත්වයන් පිළිබඳව ද ආයතනය නිරන්තරයෙන් අධීක්ෂණය කළ අතර, සීනි සමාගම්වල අදාළ නිලධාරීන්ට රෝග සහ පළිබෝධ පැතිරීම පාලනය කිරීම සඳහා කාලෝචිත පියවර ගැනීමට හැකිවන පරිදි පවතින තත්වයන් පිළිබඳව දැනුවත් කරන

ලදී. තවද, උක් රෝග හා පළිබෝධකයන් කළමනාකරණය කිරීම පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා ගොවීන්ට සහ ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන්ට නිරන්තර දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් පවත්වන ලදී. පළිබෝධනාශක යෙදීමෙන් පරිසරයට හානියක් නොවන පරිදි උක් වගාවේ කඳ හා ගොබ පණුවන් පාලනය කිරීම සඳහා කුඹුරුවලින් එකතු කරන ලද *Cotesiaflavipes* (Cameron) (Hymenoptera: Braconidae) නම් උක් වගාවේ කඳ පණුවන්ගේ කීට පරපෝෂිත කෝෂ 335ක් හිඟුරාන ප්‍රදේශයේ ගල්මඩුව උක් බීජ තවානට මුදා හරින ලදී. උක් සුදු පත්‍ර රෝගය ඇතිකරන ෆයිටොප්ලාස්මාවන් 16 Sr XI කාණ්ඩයට අයත් වන බව නැවත තහවුරු කළ අතර, එය 16 Sr XI කාණ්ඩයේ B උප කාණ්ඩයට අයත් බව වැඩි දුරටත් හඳුනා ගැනීම.

උක් ගොවිපල යාන්ත්‍රික වැඩසටහන ද රෝග පාලනය සඳහා භාවිතාවන බීජ උක් සීතල ජලයේ පොහවා ගැනීම සහ උණු දිය ප්‍රතිකාර ඒකකවල ක්‍රියාකාරිත්වය තක්සේරු කිරීම සහ ප්‍රතිකාර ධාරිතාව සකස් කිරීම සඳහා සහාය විය. එසේම සීමාසහිත ඇතිමලේ (පුද්ගලික) සීනි සමාගම සඳහා පැයට ටොන් 01ක ධාරිතාවකින් යුත් උණු දිය ප්‍රතිකාර ඒකකයක් සඳහා සැලසුම් සකස්කර දෙන ලදී.

උක් සහ එහි අතුරු නිෂ්පාදන සැකසීම හා නිෂ්පාදන සංවර්ධන වැඩසටහන උක් මත පදනම් වූ හකුරු ඇතුළු නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම සහ ඒවා සැකසීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීම අරමුණු කර අඛණ්ඩව සිදු කරන ලදී. එස්. එල්. 96 128, සී.ඕ. 775 සහ එස්. එල්. 98 2524 යන ප්‍රභේදවල ප්‍රධාන උක් යුෂ ගුණාත්මක පරාමිතීන්වල (පොල් %, බ්‍රික්ස් %, පාරිශුද්ධතාවය, පී. ඕ. සී. එස්. % සහ බර අඩු වීම) අපගමනය නිශ්චිත පශ්චාත් අස්වනු කාල සීමාවන් යටතේ ගණනය කරන ලදී.

තාක්ෂණික හුවමාරු වැඩසටහන පැවැත්වීමෙන් පර්යේෂණ සොයා ගැනීම්වල යෙදුම් ප්‍රවර්ධනය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. උක් පර්යේෂණ ආයතනය විසින් සංවර්ධනය කරන ලද උක් ප්‍රභේද, ටයින් කල්ටිවේටරය, ඇළි සාදනය සහ ඩිස්ක් මෝල්ඩරය, උක් පරතර සිටුවීමේ ක්‍රමය සහ උක් සමග අතුරු බෝග වගා කිරීම ප්‍රවර්ධනය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී. පාංශු සාරවත් බව කළමනාකරණය සහ රෝග හා පළිබෝධ කළමනාකරණය පිළිබඳ සීනි සමාගම්වල ගොවීන්ගේ හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් ද පවත්වන ලදී. තෝරාගත් ගොවීන් සඳහා ඔවුන්ගේ ව්‍යවසායකත්ව කුසලතා වැඩිදියුණු කිරීමට පුහුණු වැඩසටහන් පවත්වන ලදී. ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් 40ක් / ක්ෂේත්‍ර ආදර්ශන සහ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 13ක් පැවැත්වීමෙන් ගොවීන් 1,130ක් සහ ක්ෂේත්‍ර නිලධාරීන් 376ක් නව උක් තාක්ෂණය පිළිබඳව පුහුණු කරන ලදී. ක්ෂේත්‍ර නිලධාරීන්, ගොවීන් සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් ද සිදු කරන ලදී.

I. සීනි කම්හල් ප්‍රදේශවල ක්ෂේත්‍ර ආදර්ශන ස්ථාන 88ක් ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම.
II. බීජ උක් නිෂ්පාදනය පිළිබඳ තොරතුරු පත්‍රිකාව සහ උක් පර්යේෂණ ආයතනයේ ප්‍රවෘත්ති පත්‍රය - “පුවත් හසුන”, වෙළුම 09 අංක 01. ප්‍රකාශයට පත් කිරීම
III. නිරිවගා කළමනාකරණය (මිනිත්තු 12) සහ අතුරු බෝග වගාව (මිනිත්තු 12) පිළිබඳ උපදේශාත්මක වීඩියෝ නිෂ්පාදනය කිරීම සහ බීජ උක් නිෂ්පාදනය පිළිබඳ උපදේශන වීඩියෝ පටය (මිනිත්තු 15) සහ උක්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම පිළිබඳ වීඩියෝවක් (මිනිත්තු 24) උක් පර්යේෂණ ආයතන වෙබ් පිටුවට / යූ ටියුබ් වෙත උඩුගත කිරීම.
IV. තොරතුරු පත්‍රිකා සහ පුවත් හසුන පිටපත් 4,000 ක් මුද්‍රණය කිරීම (බීජ උක් නිෂ්පාදනය සහ උක් පර්යේෂණ ආයතන ප්‍රවෘත්ති පත්‍රය - “පුවත් හසුන”, වෙළුම 09 අංක 01).
V. කෘෂි විද්‍යාත්මක භාවිතයන්, ගොවිපල යන්ත්‍රෝපකරණ සහ පළිබෝධ සහ රෝග පාලනය පිළිබඳ ගොවි අත්පොතෙහි පිටපත් 2,350 ක් සීනි සමාගම්වල නිලධාරීන් සහ ගොවීන් අතර බෙදා හැරීම.
VI. රජරට විශ්වවිද්‍යාලයේ “කෘෂිමෙලා 2019” සහ BMICH හි “ශිල්පසේනා 2019” යන ප්‍රදර්ශනවල උක් පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ ප්‍රදර්ශන කුටි පවත්වාගෙන යාම.
VII. උක් අංශයේ පර්යේෂකයින්, ව්‍යාප්ති නිලධාරීන් සහ ගොවීන් අතර තොරතුරු/ පණිවිඩ හුවමාරුකර ගැනීම සඳහා SRI TTD, *e*-SMS සේවාව දියත් කිරීම.

සීනි කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් ද සිදු කරන ලදී.

I. උඩවලව, සෙවනගල, පැල්වත්ත, කන්තලේ සහ හිඟුරාන යන ප්‍රදේශවල හෙක්ටයාර 40.5ක ප්‍රාථමික තවාන් ස්ථාපිත කිරීම, අධීක්ෂණය කිරීම සහ බීජ උක් ටොන් 475ක් සීනි සමාගම්වලට සැපයීම.
II. උතුරු පළාතේ උක් වගාව ව්‍යාප්ත කිරීම සහ හකුරු සැකසුම් ඒකකය පිහිටුවීම සඳහා කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සමග සහයෝගයෙන් කටයුතු කිරීම.
III. නුවරඑලිය දිස්ත්‍රික්කයේ හකුරු නිෂ්පාදනය සඳහා ගෙවතු මට්ටමින් උක් වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා බීජ උක් බෙදා හැරීම සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
IV. සෙවනගල, පැල්වත්ත සහ හිඟුරාන යන ප්‍රදේශවල දැනට පවතින රෝග ආසාදිත තවාන් වෙනුවට රෝග රහිත බීජ උක් නිෂ්පාදනය සඳහා තවාන් පිහිටුවීම හා පවත්වාගෙන යාම.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ආයතනයේ මිනිස්බල අවශ්‍යතා ශක්තිමත් කිරීම සඳහා පුරප්පාඩු දොළහක් පුරවා ඇත. එනම් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු (පර්යේෂණ), නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු (පරිපාලන), පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකු, සංවර්ධන නිලධාරියෙකු, කාර්මික නිලධාරීන් තිදෙනෙකු, කළමනාකරණ සහකාරවරයකු (ගිණුම්) සහ සාමාන්‍ය සේවකයින් තිදෙනෙකු බඳවාගෙන ඇත. සුදුසුකම්ලත් අපේක්ෂකයින් නොමැතිවීම හේතුවෙන් ප්‍රධාන පර්යේෂණ නිලධාරී / තාක්ෂණ හුවමාරු නිලධාරී පුරප්පාඩු පිරවීමට නොහැකි විය. ආයතනයේ පුළුල් කරන ලද පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විද්‍යාත්මක හා තාක්ෂණික හා පරිපාලන සහායක කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව වැඩි කිරීම සඳහා සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කෙරිණි. දිගුකාලීන හා කෙටි කාලීන පුහුණු අවස්ථා ලබා දීමෙන් කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය අඛණ්ඩව සිදු කරන ලදී. මීට පෙර පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා මුදාහරින ලද පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකුට අමතරව එක් උපාධිධාරියකුට ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා අධ්‍යයන නිවාඩු ලබා දී ඇත. ගණකාධිකාරී සහ ගොවිපල අධිකාරී යන නිලධාරීන්ට ඔවුන්ගේ කාර්යයන්ට අදාළ විෂයයන් පිළිබඳව විදේශයන්හි පුහුණුව ලබා දෙන ලදී. තවද, පර්යේෂණ, තාක්ෂණික, ගිණුම්කරණ සහ පරිපාලන කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ කාර්යන්ට අදාළ කෙටි පුහුණු පාඨමාලා සඳහා සහභාගී වීමට ද අවස්ථාව ලබා දෙන ලදී.

පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා යටිතල පහසුකම් සැපයීම, කාර්ය මණ්ඩලය සඳහා සුහද සහ ආකර්ශනීය ජීවන පරිසරයක් සැපයීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරන ලදී.

I. උක් පර්යේෂණ ආයතන කොළඹ කාර්යාලය සඳහා තලාඉන්න ප්‍රදේශයේ කාර්යාල පරිශ්‍රයක් අත්පත් කර ගැනීම.
II. බෝග වැඩිදියුණු කිරීම, බෝග හා සම්පත් කළමනාකරණය, බෝග පෝෂණය හා ජෛව තාක්ෂණ විද්‍යාගාර සහ සම්මන්ත්‍රණ ශාලාව හා ශ්‍රවණාගාරයක් සඳහා පැරණි කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සහ කාර්යාලය වටා ඇති ආරක්ෂිත වැට ප්‍රතිසංස්කරණය කිරීම සහ උඩවලවෙහි ගෘහස්ථ ජල සැපයුම සඳහා ගැඹුරු ළිඳක් ඉදිකිරීම අවසන් කිරීම.
III. එන්සල්වත්ත උප මධ්‍යස්ථානයෙහි දෙමුහුන්කරණ ස්ථානයේ ගොඩනැගිලි ඉදිකිරීම.
IV. වැදගත් රසායනාගාර උපකරණ / කාර්යාල සහ ගෘහ උපකරණ හා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම.
V. දෙනියාය අභිජනන මධ්‍යස්ථානයේ පහසුකම් සංවර්ධනය කිරීම.

පාසල්, කාර්මික විද්‍යාල, කෘෂිකාර්මික පාසල් සහ විශ්වවිද්‍යාලවල සිසුන්ට පුහුණු සේවා ද ආයතනය විසින් සපයන ලදී. ඊට අමතරව රටේ උක් කර්මාන්ත සංවර්ධනය සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට අවශ්‍ය තොරතුරු ලබා දී ඇත.

ජාන ප්ලාස්ම හුවමාරුව සඳහා පාකිස්තානයේ ෆයිසලාබාද්හි උක් පර්යේෂණ ආයතනය සමග ආරම්භ කරන ලද සහයෝගිතා ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කෙරිණි.

උක් පර්යේෂණ ආයතනයේ පනත සංශෝධනය කිරීමේ කටයුතු රටේ උක් කර්මාන්ත සංවර්ධනයේ වර්තමාන මෙන්ම අනාගත අවශ්‍යතා අනුව ආයතනයේ විෂය පථය හා අධිකාරි බලය පුළුල් කිරීම අරමුණුකර අඛණ්ඩව සිදු කෙරිණි.

ආයතනයේ ස්ථාපිත කාර්යයන් ඉටු කිරීම සඳහා ඇති ප්‍රධාන සීමාකාරී සාධකය වූයේ පුහුණු හා පළපුරුදු මිනිස්බල හිඟය සහ නියමිත වේලාවට මුදල් නොලැබීමයි. ආයතනයේ අනිවාර්ය කාර්යයන් ඉටු කිරීමට නම් විද්‍යාත්මක, තාක්ෂණික හා කළමනාකරණ ශ්‍රේණිවල කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා රඳවා ගැනීම සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දිය යුතුය.

ආචාර්ය අරුණ වීජේසූරිය
අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී
උක් පර්යේෂණ ආයතනය

ආංශික වාර්තා



බෝග වැඩිදියුණු කිරීමේ අංශය

බෝග වැඩිදියුණු කිරීමේ අංශය

කාර්ය මණ්ඩලය

ආචාර්ය ඒ. විජේසූරිය (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති, දර්ශනශූරී)	-	ප්‍රධාන පර්යේෂණ නිලධාරී, අංශ ප්‍රධානී නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ හා තාක්ෂණ සම්ප්‍රේෂණ ලෙස බඳවා ගන්නා ලදී)
ඒ.එම්.එම්.එස්. පෙරේරා මහත්මිය (විද්‍යාවේදී, විද්‍යාපති)	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
ආචාර්ය ඩී. මානෙල් (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති, දර්ශනශූරී)	-	පර්යේෂණ නිලධාරී (2019 මාර්තු මස සිට ඉල්ලා අස්විය)
කේ.පී. වික්‍රමසිංහ මහතා (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති)	-	පර්යේෂණ නිලධාරී
ඒ.එල්.සී. කුමාරි මහත්මිය	-	ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරී
ආර්.ඒ. ප්‍රේමචන්ද්‍ර මහතා	-	ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරී
ඩී. වීරසිංහ මහතා	-	ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරී
බී. විතාරණ මහතා	-	වැඩ අධීක්ෂක
එස්. එච්. කරුණාරත්න මහතා	-	විද්‍යාගාර / ක්ෂේත්‍ර සහයක
ආර්.ජී.එස්.එල්. ප්‍රේමරත්න මහතා	-	විද්‍යාගාර / ක්ෂේත්‍ර සහයක
එම්.බී. රොහාන් මහතා	-	විද්‍යාගාර / ක්ෂේත්‍ර සහයක

විශේෂ ජයග්‍රහණයන්

පර්යේෂණ

- ආනයනය කරන ලද උක් ප්‍රභේද 29ක් (ව්‍යවිනාමයෙන් ප්‍රභේද 20ක් සහ චීනයෙන් ප්‍රභේද 9ක්) සහ චීනයෙන් ආනයනය කරන ලද මුහුම් 25කින් ලබාගත් බීජ පැළ 2,500ක් පමණ නිරෝධායනය කිරීම.
- දෙනියාය එන්සල්වත්ත උක් අභිජනන මධ්‍යස්ථානයේ උක් ජාන දර්ශ1,650ක්, ද්විත්-ප්‍රතිචලිත ලෙස සංරක්ෂණය කිරීම සහ උඩවලව උක් පර්යේෂණ ආයතනයේ වාණිජ හා වාණිජකරණයට ඇසන්න උක් ප්‍රභේද 45ක් අභිජනන බීජ වගාවන්හි නඩත්තු කිරීම.
- දැනට පවතින ජාන එකතුවට සැකරුම් ඔෆිසිනාරුම් දර්ශ 77ක් සහ සැකරුම් ස්පොන්ටේනියම් දර්ශ 3ක් එකතු කිරීම. මෙම දර්ශ එකතු කරගන්නා ලද්දේ 2019 වසරේ දී නුවරඑලිය දිස්ත්‍රික්කයේ කරන ලද ජාන ප්ලාස්ම ගවේෂණයේදිය.



රූපය 1 ජාන ප්ලාස්ම ගවේෂණයේදී එකතු කරගන්නා ලද උක් දර්ශ

- ක්ෂේත්‍ර ලන්තෑරුම් ක්‍රමය සහ දියර මුහුම් ක්‍රම භාවිතයෙන් මුහුම් 1,233ක් සිදු කිරීම සහ ඒවායේ සත්‍ය බීජ සැකසීම. මෙම මුහුම්වල වාණිජ මුහුම්, වන උක් දර්ශ උසස් කිරීම සඳහා වූ මුහුම් සහ සැකරුම් ඔෆිසිනාරුම් හි ගහනය වැඩිදියුණු කිරීම සඳහා වූ මුහුම් අඩංගු වේ.
- එස්. එල්. 2017 පෙළපත, 1 වන අදියරය (ප්‍රභේද 26,241), එස්. එල්. 2016 පෙළපත, 1 වන අදියරය (ප්‍රභේද 33,792), එස්. එල්. 2016 පෙළපත, දෙවන අදියරය (ප්‍රභේද 364), එස්. එල්. 2015 පෙළපත දෙවන අදියරය (ප්‍රභේද 3,000) සහ පසුකාලීන අදියරයන්හි වැඩිපුර ඇගයීම සඳහා එස්. එල්. 2015 පෙළපත, 3 වන අදියරය

(ප්‍රභේද 20), එස්. එල්. 2014 පෙළපත, 3වන අදියරය (ප්‍රභේද 362) වශයෙන් අභිජනන පෙළපත්හි වූ යෝග්‍ය ලක්ෂණ සහිත ප්‍රභේද ඉහත සඳහන් පරිදි අනුයාත වරණ අදියරයන්හි ඇගයීම සඳහා තෝරා ගැනීම.

- එස්. එල්. 2013 පෙළින් 177ක්, 2012 පෙළින් 81ක්, 2010 පෙළින් 66ක් 2010/2011 පෙළින් 30ක් 2009 පෙළින් 24 සහ 2008 පෙළින් 22ක් වශයෙන් යෝග්‍ය ලක්ෂණ සහිත (වැඩි උක් හා සීනි අස්වැන්න, නියහයට ඔරොත්තු දීම, රෝග වලට ප්‍රතිරෝධී වීම වැනි ලක්ෂණ) උක් ප්‍රභේද 400ක් හඳුනා ගැනීම සහ ඒවා ගුණනය කිරීම.
- එස්. එල්. 2008 පෙළින් 22ක්, එස්. එල්. 2007 පෙළින් 24ක්, එස්. එල්. 2006 පෙළින් 23ක්, එස්. එල්. 2005 පෙළින් 25ක්, එස්. එල්. 2005 පෙළින් 25ක්, එස්. එල්. 2004 පෙළින් 54ක්, එස්. එල්. 2003 පෙළින් 14ක්, සහ එස්. එල්. 2002 පෙළින් 26ක් ලෙස උක් හා සීනි අස්වැන්න හා රෝග ප්‍රතිරෝධිතාවය පදනම් කරගෙන යෝග්‍ය උක් ප්‍රභේද හඳුනා ගැනීම.
- එස්. එල්. 86 13 සහ එස්. එල්. 92 5588 යන ප්‍රභේද සුදු පත්‍ර රෝගය ඇති පරිසරයේ වගා කිරීම සඳහා සුදුසු ප්‍රභේද ලෙස හඳුනා ගැනීම.
- එස්. එල්. 8613 එස්. එල්. 92 5588 එස්. එල්. 99 3384 එස්. එල්. 89 309 සහ එස්. එල්. 95 4225 යන උක් ප්‍රභේදයන්හි සුදු පත්‍ර රෝගය අඩුවෙන් වාර්තා වීම හේතුවෙන් සුදු පත්‍ර රෝගයට ඔරොත්තු දීමේ හැකියාව සහිත උක් ප්‍රභේද සඳහා සිදුකරන දෙමුහුම්කරණ වැඩසටහනට දෙමව්පියන් ලෙස හඳුනා ගැනීම.
- දේශීයව එකතු කරන ලද උක් ප්‍රභේදයන්හි, ඉන්දියානු සහ ඉරාන වෛරස මාදිලියට අයත් උක් පත්‍ර රේඛීය විවිත්‍ර වෛරස රෝගකාරක වෙන්කර හඳුනා ගැනීම සහ එම රෝගකාරක ප්‍රභේදවල ජාන අනුක්‍රමික දත්ත ජාන බැංකුව වෙත ලබාදීම (ජාන බැංකු ප්‍රවේශ අංකය : MK 994186.1)
- සීනි හා උක් දඬු වල අස්වැන්න වැඩිකිරීම උදෙසා අභිජනන කටයුතු දිසානත කිරීමට සුදුසු දෙමාපිය දර්ශ හඳුනා ගැනීම සඳහා එම දර්ශයන් හි අභිජනන අගයන් ලබාගැනීමට ජාන දර්ශ 1000ක් ද, කළු දුඹුලු රෝගය, පත්‍ර ප්‍රදාහ රෝගය සහ සුදු පත්‍ර රෝගයට ප්‍රතිරෝධී ප්‍රභේද නිපදවීම සඳහා අභිජනනය කිරීමට සුදුසු දෙමාපිය දර්ශ හඳුනා ගැනීමට ජාන දර්ශ 500ක් ද අධ්‍යනය කර සුදුසු දෙමාපියන් හඳුනා ගැනීම.
- සුදු පත්‍ර රෝගය ආසාදික උක් ප්‍රභේදවලින් රෝග කාරකය ඉවත් කිරීම සඳහා පටක රෝපණය මඟින් ක්‍රමවේදයක් සකස් කිරීම.

සංවර්ධන කටයුතු

- අත්තිවාරම් බීජ උක් තවාන් ස්ථාපනය කිරීම - අක්කර 8ක පැළ වගාව හා අක්කර 7ක නිරි වගාව තුළින් උණු දිය ප්‍රතිකාර කරන ලද බීජ උක් ටොන් 98.9ක බීජ උක් උඩවලවට ලබාදීම සහ උඩවලවේ අක්කර 38ක පැළ වගාව හා අක්කර 5.4ක නිරි වගාව මඟින් උණු දිය ප්‍රතිකාර කරන ලද බීජ උක් ටොන් 26.8ක් කිලිනොච්චියට ලබා දීම.

අභ්‍යාසලාභීන් පුහුණු කිරීම

- යාපනය විශ්ව විද්‍යාලයේ (කෘෂි විද්‍යාවේදී) අවසන් වසර ශිෂ්‍යාවක වන එච්. ඒ.සී. එස් . හිරුණිකා ජයසිංහ මෙනවිය ඇයගේ උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීම පිණිස ශ්‍රී ලංකාවේ උක් නිරෝධායන මධ්‍යස්ථානයේ උක් ප්‍රභේද හා සැකරුම් ජාන ප්ලාස්මයේ උක් දර්ශවල උක් රේඛීය විවිත්‍ර වෛරස රෝග කාරකය හඳුනා ගැනීම පිළිබඳව කරන ලද අධ්‍යනය අධීක්ෂණය කිරීම.



බෝග හා සම්පත් කළමනාකරණ අංශය

බෝග හා සම්පත් කළමණාකරන අංශය

කාර්ය මණ්ඩලය

ඒ. එල්. සී. ද සිල්වා මයා (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති)	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී/අංශ ප්‍රධානී
එල්. එම්. ජේ. ආර්. විජයවර්ධන මයා (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති)	-	පර්යේෂණ නිලධාරී
පී. ඒ. ඒ. චතුරංග මයා (කෘෂි විද්‍යාවේදී)	-	කාර්ය භාර පර්යේෂණ නිලධාරී
පී. ආර්. බී. වන්ද්‍රසේන මයා (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති)	-	ගොවිපල අධිකාරී
ඩබ්ලිව්. ජී. නිමල් මයා	-	ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී
අයි. පී. මානවඩු මයා (කෘෂි ඩිප්ලෝමා)	-	තාක්ෂණ නිලධාරී
ඩී. එම්. ජී. එච්. චතුරංග මයා (කෘෂි ඩිප්ලෝමා)	-	තාක්ෂණ නිලධාරී

විශේෂ ජයග්‍රහණයන්

පර්යේෂණ

- සන්හෙම්ප් හා මූං ඇට, උක් වගා කරන ඉඩම්වල පස වැඩිදියුණු කිරීම සඳහා සුදුසු කොළ පොහොර විශේෂ බව හඳුනා ගැනීම.
- නව වල් නාශකයක් වන ග්ලූෆොසිනේට් ඇමෝනියම් **280** ග්‍රෑම්/ලීටර් එස් එල් වල් නාශකය උක් වගාවේ පශ්චාත් නිර්ගමන අවස්ථාවේදී යෙදීම ඵලදායී බව හඳුනා ගැනීම.
- නව වල් නාශකයක් වන ටෙම්බොට්‍රයෝන් වල් නාශකය උක් වගාවේ පූර්ව නිර්ගමන වල් නාශකයක් ලෙස යෙදීම ඵලදායී බව හඳුනා ගැනීම.
- **2019** වර්ෂයේ උඩවලව ප්‍රදේශයේ කෘෂි කාලගුණ දත්ත එක් රැස් කිරීම හා පරිගණකගත කිරීම සහ එහිදී මි.මී. **1,595.5**ක හොඳින් පැතිරුණ වාර්ෂික වර්ෂාපතනයක් ද මි.මී.**7.8**ක අවම වර්ෂාපතනය ජනවාරි මාසයේ සහ මි.මී. **346**ක උපරිම වර්ෂාපතනය ඔක්තෝම්බර් මාසයේ ද පැවති බව වාර්තා කිරීම.
- ලංකා සීනි (පුද්) සමාගම-සෙවනගල සමග ඒකාබද්ධව සී. ඕ. **775**, එස්. එල්. **71 30**, එස්. එල්. **83 06**, එස්. එල්. **88 116**, එස්. එල්. **90 6237**, එස්. එල්. **92 4918**, එස්. එල්. **96 128** සහ එස්. එල්. **96 328** යන උක් ප්‍රභේදවල සීනි ප්‍රතිශතයේ (පොල් %) විචලනය හඳුනා ගැනීම.

සංවර්ධන කටයුතු

- කිලිනොච්චි ආනවිලුන්දාන් ප්‍රදේශයේ උක් ගොවීන් **45** දෙනෙකුගේ සහභාගිත්වයෙන් අක්කර **15**ක උක් වගාවක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබාදීම.
- ආනවිලුන්දාන් උක් හකුරු නිෂ්පාදන ඒකකයට අවශ්‍ය උපකරණ සැපයීම (උක් ඇඹරුම් යන්ත්‍රය, කාච්චි, අච්චු හා හැඳි).
- කිලිනොච්චි ප්‍රදේශයේ ගොවීන්ට අවශ්‍ය උක් බීජ සැපයීම සඳහා වන්නේරිකුලම් ප්‍රදේශයේ හෙක්ටයාර **2**ක උක් බීජ තවානක් නඩත්තු කිරීම
- සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව විශ්වමඩු භාරතිපුරම් ගොවිපලෙහි හෙක්ටයාර **2**ක නව උක් වගාවක් නඩත්තු කිරීම
- කිලිනොච්චි උප මධ්‍යස්ථානය සඳහා නව ආරක්ෂක මුර කුටියක් ඉදිකිරීම

සේවාවන්

- පර්යේෂණ ගොවිපලෙහි ඩී 3, ඩී 4 සහ ඩී 5 යන ප්‍රදේශවල පර්යේෂණ වගාවන් සහ බීජ උක් තවාන් සඳහා හෙක්ටයාර **30**ක බිම් සකස් කිරීම.
- පර්යේෂණ ගොවිපලෙහි ඩී 4 සහ ඩී 5 ප්‍රදේශයේ හෙක්ටයාර **10**ක බීජ උක් තවාන් ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම.
- පර්යේෂණ ගොවිපල විසින් උක් ටොන් **114**ක් කර්මාන්තශාලා වෙත සැපයීම.
- කිලිනොච්චි ප්‍රදේශයේ උක් වගාව ව්‍යාප්ත කිරීම සඳහා උණුදිය ප්‍රතිකාර කරන ලද බීජ උක් ටොන් **15**ක් සැපයීම.
- පර්යේෂණ ගොවිපලෙහි ක්ෂේත්‍රවලට ජල සම්පාදනය කිරීම සඳහා ජල පොම්පාගාර **2**ක් ඉදිකිරීම.

- පර්යේෂණ වගාවන් සඳහා වල් ඌරන් හා ඉත්තෑවන්ගෙන්වන හානි අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

ශිෂ්‍ය පුහුණුවීම්

- ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඒ.එල්.සී.ද සිල්වා මහතා විසින් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ එච්.එම්.එම්. බුද්ධිකා ශිෂ්‍යාවගේ පර්යේෂණ ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම.

නිලධාරී පුහුණුවීම්

- පර්යේෂණ නිලධාරී එල්.එම්.ජේ.ආර්. විජයවර්ධන මහතා **2019** ඔක්තෝම්බර් **29** සිට **31** දක්වා නුගේගොඩ ජාතික පිරිසිදු නිෂ්පාදන මධ්‍යස්ථානය (National Cleaner Production Center) විසින් පවත්වන ලද ජල විගණනය සහ ජල පිය සටහන ගණනය කිරීම පිළිබඳ උපදේශන වැඩසටහනකට සහභාගී විය.



බෝග පෝෂණ අංශය

බෝග පෝෂණ අංශය

කාර්ය මණ්ඩලය

බී.ආර්. කුලසේකර මහතා (කෘෂි විද්‍යාවේදී)	-	කාර්ය භාර පර්යේෂණ නිලධාරී
එච්.ඒ.එස්. වීරසිංහ මහතා (විද්‍යාවේදී, විද්‍යාපති, දර්ශනපති)	-	පර්යේෂණ නිලධාරී
යූ.ඩබ්ලිව්.එල්.එම්. කුමාරසිරි මහතා (කෘෂි විද්‍යාවේදී)	-	පර්යේෂණ නිලධාරී
ජී.එස්. උඩවත්ත මහතා	-	තාක්ෂණ නිලධාරී
ඩබ්ලිව්.ඒ.එස්. වීජේසූරිය මහත්මිය (කෘෂි ඩිප්ලෝමා)	-	තාක්ෂණ නිලධාරී
එස්.එම්.ඒ.ඩී. කුමාරි මෙනවිය (කෘෂි ඩිප්ලෝමා)	-	තාක්ෂණ නිලධාරී
ඒ.ඩබ්ලිව්.ඊ.ඩී. දර්ශනිකා මෙනවිය (කෘෂි ඩිප්ලෝමා)	-	තාක්ෂණ නිලධාරී
පී.ඩබ්ලිව්. කුලතුංග මහතා	-	විද්‍යාගාර / ක්ෂේත්‍ර උපස්ථායක
ජේ. ගුණසිරි මහතා	-	විද්‍යාගාර / ක්ෂේත්‍ර උපස්ථායක

විශේෂ ජයග්‍රහණයන්

පර්යේෂණ

- සෙවනගල උක් වගාකරන ප්‍රදේශවල රතු දුඹුරු පස් හා අව තියුමික් ග්ලේ (LHG) පස්වල කැටායන හුවමාරු ධාරිතාවය පිළිවෙලින් **9.53** හා **7.89** cm 01(+)/kg) වන අතර එම අගයන් අතර වෙසෙසි වෙනසක් පවතින බව හඳුනා ගැනීම.
- සෙවනගල රතු දුඹුරු පස් කාණ්ඩය යටතේ පවතින වර්ෂා පෝෂිත හා වාරිපෝෂිත පස්වල හා එම ප්‍රදේශයේ අව තියුමික් ග්ලේ පස් කාණ්ඩය යටතේ වාරිපෝෂිත ප්‍රදේශවල පී එච්(P^H) අගය **6.5** ආසන්න අගයක පැවතීම උක් වගාවට යෝග්‍ය බව හඳුනා ගැනීම. සෙවනගල අව තියුමික් ග්ලේ පස් කාණ්ඩය යටතේ වර්ෂා පෝෂිත ප්‍රදේශවල pH අගය **9** දක්වා වැඩිවීම උක් වගාවට අයෝග්‍ය තත්වයට පත්වෙමින් තිබීම හඳුනා ගැනීම.
- සෙවනගල උක් වගා කරන ප්‍රදේශයේ උක් ශාකයට අවශෝෂණය කළ හැකි පොස්පරස් හා පොටෑසියම්වල විශාල විචලනයක් හඳුනා ගැනීම.
- පැල්වත්ත කේන්ද්‍රීය වතුයායේ උක් වගා කරන ප්‍රදේශවල කාබනික ද්‍රව්‍ය ප්‍රතිශතය **0.2** සිට **1%** දක්වා විචලනය වන බව හඳුනා ගැනීම හා එය ශාක පෝෂණයට බලපෑම් ඇති කළ හැකි බව හඳුනාගැනීම.
- පැල්වත්ත ජනාවාස ප්‍රදේශ යටතේ උක් වගා කරන භූමියේ pH අගය **6** සිට **9** දක්වා විචලනය වන අතර එයින් සැලකිය යුතු භූමි ප්‍රමාණයක pH අගය උක් ශාකයට අයෝග්‍ය වෙමින් පවතින බව හඳුනා ගැනීම.
- එප්පාවල රොක් පොස්පේට් සහ අධි ශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට්, ස්කාගාර අපද්‍රව්‍ය (Vinasse) සමග මිශ්‍ර කිරීමෙන් නිරි වගාවන්හි දී ශාකයට අවශෝෂණය කළ හැකි පොස්පරස් ප්‍රමාණය ඉහළ යන බව හඳුනා ගැනීම.
- සීනි කර්මාන්තායතනවලින් ඉවතලන අපද්‍රව්‍ය සහ කෘත්‍රිම පෙහොර භාවිතා කරමින් නිපදවන ලද කොම්පෝස්ට් මගින් කැට ආකාර කාබනික-ඛනිජ පොහොර නිපදවීමේ මූලික කටයුතු සම්පූර්ණ කිරීම.

සේවාවන්

- උක් දඬු නියැදි **2,310** ක ගුණාත්මය පිළිබඳ විශ්ලේෂණ කටයුතු සිදුකිරීම (බෝග වැඩිදියුණු කිරීමේ අංශය සඳහා නියැදි **1,704**, බෝග හා සම්පත් කළමණාකරණ අංශය සඳහා **248**, බෝග ආරක්ෂණ අංශය සඳහා නියැදි **196**, සැකසුම් තාක්ෂණ අංශය සඳහා නියැදි **80** ක් යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශය නියැදි **90**)
- බෝග හා සම්පත් කළමනාකරණ, බෝග ආරක්ෂණ සහ සැකසුම් තාක්ෂණ අංශයන්හි පර්යේෂණයන්ට අදාළ පාංශු සහ ශාක පත්‍ර නියැදියන් විශ්ලේෂණය කිරීම.
- හිඟුරාන උක් වගා කරන ප්‍රදේශයන්හි ගොවි බිම් **02**ක් සහ එක් තවාන් පරිශ්‍රයක් සඳහා පාංශු විශ්ලේෂණ සේවාවන් සැපයීම.
- උක් යුෂ විශ්ලේෂණ කටයුතුවල දී භාවිතා කෙරෙන ලෙඩ ඇසිටේට් නම් රසායනික ද්‍රව්‍ය වෙනුවට පරිසර හිතකාමී ඔක්ටපොල් (Octapol) නම් රසායනික ද්‍රව්‍ය භාවිතයට උචිතදැයි පරීක්ෂාවට ලක්කිරීම.

- උක් වගාවේ පොහොර භාවිතය පිළිබඳ තොරතුරු පොහොර ලේකම් කාර්යාලය වෙත ලබාදීම.
- ලංකා සිනි පුද්ගලික සමාගම - සෙවනගල ඒකකය හා සහභාගිත්වයෙන් සිදු කරන ලද එස්. එල්. 96 128 ප්‍රභේදයේ Pol % අගය පිළිබඳ විශ්ලේෂණ කටයුතු සඳහා සක්‍රිය දායකත්වයක් සැපයීම.
- ආරක්ෂක අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි, උක් කර්මාන්තයේ දී භාවිතයට ගනු ලබන, ආනයනික රසායනික ද්‍රව්‍ය සහ මෙවලම් පිළිබඳ වාර්තාවක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.
- උක් වගාව තුළ තිරසාර නයිට්‍රජන් කළමනාකරණය පිළිබඳ වාර්තාවක් මහවැලි සංවර්ධන අධිකාරියේ ඉල්ලීම පරිදි වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.
- කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ දී පවත්වන ලද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලිකත්වයෙන් සංවිධානය වූ 'First Nitro – Innovation' නම් අන්තර්ජාතික සමුළුව සහ ප්‍රදර්ශනයට සහභාගී වීම.
- ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තය තුළ රසායනික ද්‍රව්‍ය භාවිතය පිළිබඳ වාර්තාවක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.
- 2020 වර්ෂය සඳහා උක් වගාවේ භාවිතයට අවශ්‍ය යැයි අපේක්ෂිත පොහොර ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.
- උක් වගාව සඳහා, නව සංයුක්ත පොහොර භාවිතය පිළිබඳව ඒකාබද්ධ ව්‍යාපෘතියක් සී. අයි. සී කෘෂි ව්‍යාපාර පුද්ගලික ආයතනය සමග එක්ව ආරම්භ කිරීම.

නිර්දේශයන්

- උක් කර්මාන්තයේ අතුරුඵලවන ව්නෑස් සහ පෙරහන්මඩ සෙවනගල උක් වගා කෙරෙන ක්ෂේත්‍රයන්හි යෙදීම සම්බන්ධයෙන් නිර්දේශයක් ලබා දීම.



බෝග ආරක්ෂණ අංශය

බෝග ආරක්ෂණ අංශය

කාර්ය මණ්ඩලය

වී. කේ. ඒ. එස්. එම්. වනසිංහ මිය (විද්‍යාවේදී, විද්‍යාපති)	-	කාර්ය භාර පර්යේෂණ නිලධාරී
ඒ. එන්. ඩබ්ලිව්. එස්. තුෂාරි මිය (විද්‍යාවේදී)	-	පර්යේෂණ නිලධාරී (2017.02.01 දින සිට අධ්‍යන නිවාඩු)
කේ. එම්. ජී. වංචලා මිය (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති)	-	පර්යේෂණ නිලධාරී
වයි. ඒ. පී. කේ. දයාසේන මයා (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති)	-	පර්යේෂණ නිලධාරී
ඒ. එල්. සී. කෝදාගොඩ මයා (කෘෂි ඩිප්ලෝමා)	-	තාක්ෂණ නිලධාරී
කේ.පී. හර්ෂනී මෙනවිය (කෘෂි ඩිප්ලෝමා)	-	තාක්ෂණ නිලධාරී (2019.10.01 සිට)
ආර්.කේ.පී. ජීවන්ති මෙනවිය (ආහාර තාක්ෂණ ඩිප්ලෝමා)	-	තාක්ෂණ නිලධාරී (2019.10.03 සිට)
එම්. ආර්. ප්‍රේමලාල් මයා	-	විද්‍යාගාර /ක්ෂේත්‍ර උපස්ථායක
ජේ. කේ. යූ. මධුසංඛ මයා	-	විද්‍යාගාර /ක්ෂේත්‍ර උපස්ථායක

විශේෂ ජයග්‍රහණයන්

පර්යේෂණ

- දේශීය තත්ත්ව යටතේ දී උක් වගාවේ කළු දුඹුලු රෝගය සඳහා ප්‍රතිරෝධීතාව දැක්වූ උක් ප්‍රභේද **344**ක් දැනට පවතින උක් ජානප්ලාස්මය තුළින් හඳුනා ගැනීම.
- දේශීය තත්ව යටතේදී උක් වගාවේ පත්‍ර ප්‍රදාහ රෝගය සඳහා ප්‍රතිරෝධීතාව දැක්වූ උක් ප්‍රභේද **155**ක් දැනට පවතින උක් ජානප්ලස්මය තුළින් හඳුනා ගැනීම.
- උක් වගාවේ සුදු පත්‍ර රෝගය ඇති කරන ෆයිටොප්ලාස්මාවන් උක් දඬු තුළ පවතින ප්‍රමාණය මැන ගැනීම සඳහා ක්‍රමවේදයක් QPCR මගින් ප්‍රශස්තිකරණය කිරීම.
- සැලිසිලික් අම්ලය, ස්ට්‍රෙප්ටොමයිසින් හා මෙටට්‍රොසයික්ලීන් යන ප්‍රතිජීවක, සුදු පත්‍ර රෝගය සාදන ෆයිටොප්ලාස්මාවන් බැහැර කිරීම සඳහා ඵලදායී බව අනුක ජීව විද්‍යාත්මකව තහවුරු කරන ලදී. එම ඵලදායීතාවන් පිළිවෙලින් **98%, 84%** හා **83%** ක් විය.
- වර්තමානයේ භාවිතවන බීජ උක් උණු දිය ප්‍රතිකාරය මගින් මුල් අවස්ථාවේදී පවතින ෆයිටොප්ලාස්මා ප්‍රමාණය **70%** කින් පමණ අඩුකරන බව අණුක ජීව විද්‍යාත්මක හා QPCR මගින් තහවුරු කර ගැනීම.
- උක් වගාවේ කළු දුඹුලු රෝගය ඇති කරන දිලීරයේ ජාන සංයුතියේ අනුපිළිවෙල අධ්‍යයනය පිළිබඳ සිදු කළ පර්යේෂණ මගින්, එම දිලීරයේ විවිධ මාදිලිවල ජාන සංයුතියේ වෙනසක් නැති බව තහවුරු කරන ලදී.
- උක් වගාවේ සුදු පත්‍ර රෝගයට හේතුවන ෆයිටොප්ලාස්මා රෝග කාරකය, **165** x I-B නම් ෆයිටොප්ලාස්මා උප කාණ්ඩයට අයත් විශේෂයක් බවත් එය ශ්‍රී ලංකාවේ උක් වගාකරන සෑම ප්‍රදේශයකටම ව්‍යාප්ත වී ඇති උප කාණ්ඩය බවත් තහවුරු කරගන්නා ලදී.
- සුදු පත්‍ර රෝග වාහක, ඩෙල්ටසෙෆලස් මෙනොනිගේ ගහනය අධ්‍යයනය සඳහා වඩාත්ම සුදුසු ක්‍රමය කෘමී අතංගු භාවිතය බව හඳුනා ගැනීම.
- සුදු පත්‍ර රෝග වාහක කෘමියාගේ උපරිම පියාසර දුර මීටර **75**ක් වන අතර එක් දිනක දී මධ්‍ය පියාසර දුර මීටර **2.3**ක් බව අඳුනා ගැනීම.
- සුදු පත්‍ර රෝග වාහකයාගේ විලෝපික කෘමි විශේෂ දෙකක් ලෙස, කතුරන් විශේෂයක් සහ රොවර කුරුමිණි විශේෂයක් හඳුනාගැනීම (රූපය **1**)



රූපය **1** - සුදු පත්‍ර රෝග වාහකයාගේ විලෝපික කෘමි විශේෂයක් ලෙස හඳුනාගත් රෝවර කුරුමිණි විශේෂය

- උක් වගාවේ රෝග ප්‍රතිශතය ඉහළ යාම සඳහා බලපාන ප්‍රධාන ලක්ෂණ ලෙස සුදු පත්‍ර රෝග වාහක කෘමියාගේ එක්රැස්වීම, ආහාර රටාව හා වැඩිහිටි සතුන්ගේ ජීවිත කාලය යන සාධක හඳුනා ගැනීම.
- සුදු පත්‍ර රෝග වාහකයාට රෝගය ව්‍යාප්ත කිරීම සඳහා උක් ශාකයේ වැඩි පත්‍ර ප්‍රමාණයක් තිබීම, කඳ හා පත්‍රය අතර ආනතිය වැඩිවීම සහ පත්‍ර අතර දුර අඩුවීම යන ලක්ෂණ හඳුනා ගැනීම.
- උක් පත්‍රයේ රතු හා කොළ වර්ණ ප්‍රමාණය වැඩිවීම, පත්‍රයේ ඉටි ප්‍රතිශතය වැඩිවීම, කෙට් ට්‍රයිසෝම් සහ පටු පූටිකා පැවතීම, සංවහන කලාපයේ කුඩා සංවහන නාල සනකම ග්ලෝයම් තන්තු පැවතීම සහ පත්‍රය මතුපිට සිට සංවහන කලාපයට ඇති දුර වැඩිවීම යන සාධක රෝග වාහක කෘමියාට ප්‍රතිරෝධී ලක්ෂණ ලෙස ක්‍රියා කරන බව හඳුනා ගැනීම.
- නිරන්තර ක්ෂේත්‍ර අධ්‍යනය මගින් රෝග පළිබෝධවල හදිසි වැඩිවීම පාලනය සඳහා අදාළ අංශ දැනුවත් කිරීම සහ අවශ්‍ය මර්දන කටයුතු සිදුකිරීම.
- සෙවනගල සහ ඇතිමලේ උක් වගාවල ඇති වූ උක් මයිටාවන්ගේ ගහනය පාලනය කිරීම.
- පැල්වත්ත සහ කන්තලේ උක් වගාවල ඇති වූ සේනා දළඹු ගහනය පාලනය කිරීම.
- පැල්වත්ත හා හිඟුරාන උක් වගාවල ඇති වූ කඳන් විදින පණුවාගේ හානිය මර්දනය කිරීම.
- හිඟුරාන ගොවිපුපුර ප්‍රදේශයේ ඇතිවූ පයිරිල්ලා පත්‍ර කිඩෑවාගේ හානිය මර්දනය කිරීම.



රූපය 2: හානිවූ උක් පත්‍රමත සේනා දළඹුවාගේ කීට අවස්ථා: a: මූලික කීට අවස්ථාව, b: වැඩුනු කීට අවස්තාව (පැල්වත්ත සීනි සමාගමට අයත් කුකුරම්පොල බීජ උක් තවාන) c: වැඩුනු සේනා දළඹු කීටයන්, d: ස්පයිඩර් මයිටාවන් නිසා දැඩි ලෙස හානියට පත්වූ උක් වගාවක්

- උක් වගාවේ කඳන් විදින පණුවාගේ කීට පරපෝෂිතයන් කොටෙසියා ෆ්ලාවිපිස් කොකුන් 335 ක් පමණ හිඟුරාණ ප්‍රදේශයේ තවාන් වලට නිකුත් කිරීම.

අභ්‍යාසලාභීන් පුහුණු කිරීම

- ජාතික ආධුනිකත්ව පුහුණු කිරීමේ අධිකාරියට අනුබද්ධ කේ.ජී. දිනෙල්කා ශිෂ්‍යාවට උක් පළිබෝධ සහ රෝග පාලනය පිළිබඳ සය මාසික පුහුණුවක් ලබාදීම.
- සබරගමුව විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ අවසන් වසර ශිෂ්‍යාවක් වන එච්.එම්.ඒ.එස්. ජයතිලක ශිෂ්‍යාවගේ විද්‍යාවේදී (විශේෂ) පාඨමාලාව සම්පූර්ණ කිරීම පිණිස කරන ලද "උක් වගාවේ සුදු පත්‍ර රෝග වාහක කෘමියාගේ ගහන ගණත්වය අධ්‍යනයට වඩාත් සුදුසු අධ්‍යන ක්‍රම" යන පර්යේෂණය අධීක්ෂණය කිරීම.
- සබරගමුව විශ්වවිද්‍යාලයේ කෘෂි විදයා පීඨයේ අවසන් වසර ශිෂ්‍යාවක් වන ඒ.එම්.එල්.සී.එම්. වන්ද්‍රසේකර ශිෂ්‍යයාගේ විද්‍යාවේදී (විශේෂ) පාඨමාලාව සම්පූර්ණ කිරීම පිණිස කරන ලද "උක් වගාවේ සුදු පත්‍ර රෝග වාහකයාගේ උපරිම පියාසර දුර අධ්‍යනය" යන පර්යේෂණය අධීක්ෂණය කිරීම
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ අවසන් වසර ශිෂ්‍යාවක් වන එම්.ඕ.එන්. නවරත්න ශිෂ්‍යාවගේ විද්‍යාවේදී (විශේෂ) පාඨමාලාව සම්පූර්ණ කිරීම පිණිස කරන ලද "උක් වගාවේ සුදු පත්‍ර රෝගය හඳුනා ගැනීම සඳහා DNA ඒෂණ සංවර්ධනය කිරීම " යන පර්යේෂණය අධීක්ෂණය කිරීම
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ අවසන් වසර ශිෂ්‍යාවක් වන එන්.ජී.එම්.එම්. ධර්මසේන ශිෂ්‍යාවගේ විද්‍යාවේදී (විශේෂ) පාඨමාලාව සම්පූර්ණ කිරීම පිණිස කරන ලද "සුදු පත්‍ර රෝග වාහකයාගේ ජාන විවිධත්වය හඳුනා ගැනීම සහ තහවුරු කිරීම" යන පර්යේෂණය අධීක්ෂණය කිරීම.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ අවසන් වසර ශිෂ්‍යාවක් වන බී.එම්.එන්.ජේ. බස්නායක ශිෂ්‍යාවගේ විද්‍යාවේදී (විශේෂ) පාඨමාලාව සම්පූර්ණ කිරීම පිණිස කරන ලද "පොහොර යොදන ලද උක්

ශාකවල සුදු පත්‍ර රෝග කාරක ෆයිටොප්ලාස්මා හඳුනා ගැනීම සහ ගණනය කිරීම" යන පර්යේෂණය අධීක්ෂණය කිරීම.

- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ අවසන් වසර ශිෂ්‍යාවක් වන ආර්.එන්.එන්.කේ. රත්නායක ශිෂ්‍යාවගේ විද්‍යාවේදී (විශේෂ) පාඨමාලාව සම්පූර්ණ කිරීම පිණිස කරන ලද "උක් වගාවේ කළු දුඹුලු රෝගය මර්දනය සඳහා ශාකය තුළ වසන සහජීවී ක්ෂුද්‍ර ජීවී සංගම් වලට ඇති හැකියාව" යන පර්යේෂණය අධීක්ෂණය කිරීම.



යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශය

යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශය

කාර්ය මණ්ඩලය

කේ.එච්.ඩී. අබේරත්න මහතා (කෘෂි විද්‍යාවේදී)	-	කාර්යය භාර පර්යේෂණ නිලධාරී
කේ. ටී. ආරියවංශ මහතා (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති)	-	පර්යේෂණ නිලධාරී (2018.06.04 දින සිට අධ්‍යයන නිවාඩු ලබා ඇත)
ඒ.එම්.එස්.ඒ. ප්‍රනාන්දු මහතා (තාක්ෂණික ඩිප්ලෝමා)	-	ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී
ඩබ්ලිව්.එම්. අනුරපාල මහතා	-	තාක්ෂණ නිලධාරී
වී. අබේගුනවර්ධන මහතා	-	පෑස්සුම්කරු
ජී. ආරියරත්න මහතා	-	වැද්දුම්කරු
ඩබ්ලිව්.ඒ. ජේමවන්ද්‍ර මහතා	-	කම්මල්කරු
ඩී.එම්.එල්. වීරසිරි මහතා	-	කාර්මික
ඩී.එම්. වීරසිරි මහතා	-	රසායනාගාර / ක්ෂේත්‍ර උපස්ථායක

විශේෂ ජයග්‍රහණයන්

පර්යේෂණ

- කන්තලේ බීජ උක් ප්‍රතිකාර ඒකකයේ සිසිල් දිය සහ උණු දිය ප්‍රතිකාර ඒකකවල ක්‍රියාකාරිත්වයන් පරීක්ෂා කර නව ප්‍රතිකාර ධාරිතාවන් සකස් කිරීම.
- ඇනිමලේ වැව්ලි (පුද්ගලික) සමාගම සඳහා පැයට ටොන් එකක ප්‍රතිකාර ධාරිතාවයකින් යුත් උණු දිය ප්‍රතිකාර ඒකකයක් සැලසුම් කිරීම.
- උඩවලව උක් පර්යේෂණ ආයතනයේ ස්ථාපික කර ඇති බීජ උක් ප්‍රතිකාර ඒකකයේ උණු වතුර පද්ධතිය සඳහා නව විදුලි පුවරු සවි කිරීම සහ වතුර පොහවා ගැනීමේ පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම.

සේවාවන්

- කිලිනොච්චි ආනවිලුන්දන් හි පිහිටි උක් හකුරු කර්මාන්ත ශාලාවේ උඳුන් පද්ධතිය හා එයට අදාළ උපාංග ස්ථාපනය කිරීම සඳහා තාක්ෂණික උපදෙස් ලබා දීම හා එහි ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම.
- ආයතනයේ උක් හකුරු නිෂ්පාදන ඒකකයේ පරිහරණය සඳහා ධාරිතාවය ලීටර් **160** බැගින් වූ මළ නොබැඳෙන වානේ තාවිලු **04**ක්, ධාරිතාවය ලීටර් **700** කින් යුත් යුෂ එකතු කිරීමේ ටැංකියක්, හැඳි සහ පිහියා උපකරණ ආදිය නිපදවීම.
- කන්තලේ අක්කර **200**ක තවාන් ප්‍රදේශය වටා සූර්ය බලයෙන් ක්‍රියාත්මකවන විදුලි වැට ප්‍රතිසංස්කරණය කිරීම.
- ප්‍රධාන ගබඩාව සඳහා අඩි **60 x 40** ප්‍රමාණයේ යකඩ ව්‍යුහගත අංගනයක් සැලසුම් කිරීම සහ ඉදිකිරීම සම්පූර්ණ කිරීම.
- ආයතනයේ බෝධිය වටපිටාව සංවර්ධනය කිරීම හා භූමි අලංකරණය කිරීම.
- පර්යේෂණ සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සේවා සැපයීම.
- උක් පර්යේෂණ ආයතනයේ වාහන සහ ගොවිපල උපකරණ නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම.



සැකසුම් තාක්ෂණ අංශය

සැකසුම් තාක්ෂණ අංශය

කාර්ය මණ්ඩලය

එස්.එම්.ටී.ඒ. මාරලන්ද මිය (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති)	-	කාර්ය භාර පර්යේෂණ නිලධාරී
එම්.ජී.ජී.එන්. සෙව්වන්දි මිය (ඉංජිනේරු විද්‍යාවේදී)	-	පර්යේෂණ නිලධාරී
එම්.ඒ.ආර්.අයි. පෙරේරා මිය (කෘෂිකර්ම ඩිප්ලෝමා)	-	තාක්ෂණ නිලධාරී
ඩබ්ලිව්.කේ.ඩී.එස්. කරුණාරත්න (කෘෂිකර්ම ඩිප්ලෝමා)	-	තාක්ෂණ නිලධාරී

විශේෂ ජයග්‍රහණයන්

පර්යේෂණ

- පොස්පේට් දියකිරීමේ හැකියාව ඇති ක්ෂුද්‍රජීවීන් ඇතුළත්කොට සෑදූ පේව පොහොරෙහි ඵලදායීතාවය එස්. එල්. **96 128** ප්‍රභේදය භාවිතා කොට ක්ෂේත්‍ර මට්ටමේ අධ්‍යයනය කිරීම.
- උක් හකුරුවල පෝෂණ අන්තර්ගතය විශ්ලේෂණය කිරීම.
- සෘජුකෝණාශ්‍රාකාර හැඩයෙන් යුතු හකුරු නිෂ්පාදනය කිරීම සඳහා හකුරු අච්චු සැලසුම් කිරීම.
- එස්. එල්. **96 128** සහ සී. ඕ. **775** යන උක් ප්‍රභේද දෙකෙහි විවිධ බෝග වයස්වල (මාස **10, 11, 12, 13, 14,**) වර්ෂා පෝෂිත හා වාරිමාර්ග තත්ව යටතේ දී උක් ගසෙහි සීනි ප්‍රමාණය විශ්ලේෂණය කිරීම.
- නිශ්චිත පසු අස්වනු නෙලීමේ කාල සීමාව යටතේ එස්. එල්. **96 128,** සී. ඕ. **775** සහ එස්. එල්. **98 2524** යන උක් ප්‍රභේදවල ප්‍රධාන උක් යුෂ ගුණනාත්මක ප්‍රමිතීන් ගණනය කිරීම.
- පත්‍ර යෙදීම සහ ද්විමය කැටායන පාංශු ප්‍රතිකාර මගින් පසු අස්වනු හානිය අවම කිරීම සඳහා බඳුන් තුළ අත්හදා බැලීම.

සේවාවන්

- කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය, රුහුණු, ශ්‍රී ජයවර්ධනපුර සහ වයඹ විශ්වවිද්‍යාල, රක්මලාන වෘක්ෂීය පුහුණු විද්‍යාලය සහ ජාතික වැවිලි කළමනාකරණ ආයතනයන්හි සිසුන්හට උක් සැකසුම් හා අතුරු නිෂ්පාදන පිළිබඳව පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- බෝග ආරක්ෂණ අංශය මගින් සුදු පත්‍ර රෝග වාහක ගහනය සඳහා අබ ශාකයේ ඇති බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා සිදු කරන ලද පර්යේෂණයේ බැක්ටීරියා ගහනය ලබා ගැනීම.
- ක්ෂේත්‍ර අධ්‍යයන වලින් ලබා ගන්නා ලද උක් භාවිතයෙන් හකුරු කිලෝ ග්‍රෑම් **1,970**ක් නිෂ්පාදනය කිරීම.
- ප්‍රදර්ශන සඳහා විවිධ හැඩයෙන් හා රසයෙන් යුතු හකුරු, උක් බීම සහ උක් පැණි නිෂ්පාදනය කිරීම.



ආර්ථික විද්‍යා, පේවමිතික හා තොරතුරු තාක්ෂණ අංශය

ආර්ථික විද්‍යා, පෛවමිතික හා තොරතුරු තාක්ෂණ අංශය

කාර්ය මණ්ඩලය

කේ.ඒ.ඩී. කොඩිතුවක්කු මහතා (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති)	-	ජ්‍යෝෂ්ඨ පර්යේෂණ නිලධාරී සහ අංශ ප්‍රධානී
බී.ඩී.එස්.කේ. ආරියවංශ මහත්මිය (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති)	-	ජ්‍යෝෂ්ඨ පර්යේෂණ නිලධාරී
කේ.ජී.එස්.යූ. ආර්. ඛණ්ඩාර (විද්‍යාවේදී, HNDIT, CCNA)	-	තාක්ෂණ නිලධාරී

විශේෂ ජයග්‍රහණයන්

පර්යේෂණ

- උක් වගා කිරීමේ පිරිවැය හා ආදායම් දත්ත 2019 වර්ෂයේ මිල ගණන් අනුව යාවත්කාලීන කිරීම. ඒ අනුව හෙක්ටයාරයක උක් වගාවක් සඳහා සාමාන්‍ය පිරිවැය සෙවනගල වාරිපෝෂිත, සෙවනගල වර්ෂාපෝෂිත, පැල්වත්ත හා හිඟුරාන යන ප්‍රදේශ සඳහා පිළිවෙලින් රු.359,002.00, රු.251,275.00, රු.189,537.00 සහ රු.243,214.00 විය. උක් වගාවේ හෙක්ටයාරයක සාමාන්‍ය ශුද්ධ වාර්ෂික ආදායම සෙවනගල වාරිපෝෂිත හා වර්ෂාපෝෂිත ප්‍රදේශ සඳහා පිළිවෙලින් රු.236,373.00 හා රු.128,225.00 විය. පැල්වත්ත වර්ෂාපෝෂිත ප්‍රදේශයේ වාර්ෂික ශුද්ධ ආදායම හෙක්ටයාරයකට රුපියල් 103,338 හා හිඟුරාන ප්‍රදේශයේ වාරිපෝෂිත තත්ත්ව යටතේ වාර්ෂික ශුද්ධ ආදායම රුපියල් 141,786 විය.
- 2018 වර්ෂයට අදාළව සෙවනගල, පැල්වත්ත හා ගල්ඔය සිනි කර්මාන්ත ශාලා සඳහා උක් ටොන් එකක වාණිජ වටිනාකම පිළිවෙලින් රු.17,770.00, රු.16,698.00 හා රු 14,310.00ක් විය. ඒ අනුව 2018 වර්ෂයේ සෙවනගල වාරිපෝෂිත කලාපයේ, පැල්වත්ත වර්ෂාපෝෂිත කලාපයේ හා ගල්ඔය ප්‍රදේශයේ හෙක්ටයාරයකින් නිපදවන උක්වල මුළු වාණිජ වටිනාකම පිළිවෙලින් රු.මිලියන 1.2, 0.76 හා 0.34ක් වූ අතර, එය තරහකාරී අනෙකුත් බෝගවලට සාපේක්ෂව ඉතා ඉහළ අගයක් ගනී.
- 2019 වර්ෂය තුළ ශ්‍රී ලංකාවට ආනයනය කළ සීනි ප්‍රමාණය හා ඒ සඳහා වියදම පිළිවෙලින් ටොන් 556,000 හා රුපියල් බිලියන 35.7ක් විය.
- උක් පර්යේෂණ ආයතනයට අයත් කන්තලේ උණුදිය ප්‍රතිකාර ඒකකයේ උක් ටොන් එකක උණුදිය ප්‍රතිකාර වියදම ටොන් එකකට රුපියල් 8,675.00 හා බීජ උක් ටොන් එකක සම්පූර්ණ නිෂ්පාදන වියදම රුපියල් 16,694.00ක් ලෙස ඇස්තමේන්තුගත කරන ලදී.

සේවාවන්

- උක් පර්යේෂණ ආයතනයේ වෙබ්අඩවිය www.sugarres.lk නැවත නිර්මාණය කිරීම සහ යාවත්කාලීන කිරීම. උක් පර්යේෂණ ආයතනයේ 'Sugarcane Sri Lanka' ජර්නලයේ සිව්වන කලාපය සඳහා පර්යේෂණ පත්‍රිකා එකතුකර ඒවා අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා කර්තෘන් වෙත යොමු කිරීම.

ආයතනයේ අනෙකුත් අංශවලට සපයන ලද සේවා

- බෝග වැඩිදියුණු කිරීමේ අංශය, බෝග පෝෂණ අංශය හා සැකසුම් තාක්ෂණ අංශවලට අවශ්‍ය පර්යේෂණ සැලසුම් නිර්මාණය කිරීම.
- ආයතනය තුළ තොරතුරු තාක්ෂණයට අදාළ කාර්යන් ඉටු කිරීම.
- උක් පර්යේෂණ ආයතනයේ 2018 වර්ෂයට අදාළ INFORM දත්ත ගබඩාව සැකසීම හා එය ශ්‍රී ලංකා කෘෂිකාර්මික ප්‍රතිපත්ති සභාව වෙත ලබා දීම.
- ජාතික වෘක්ෂිය පුහුණු අධිකාරියේ සිසුන් පස් දෙනෙකු පරිගණක මෘදුකාංග භාවිතය පිළිබඳ මාස 06ක පුහුණුවක් ලබා දීම.



තාක්ෂණ සම්ප්‍රේෂණ හා සංවර්ධන අංශය

තාක්ෂණ සම්ප්‍රේෂණ සහ සංවර්ධන අංශය

කාර්ය මණ්ඩලය

ආචාර්ය. එම්.එස්.පෙරේරා (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති, දර්ශන ගුරු)	-	ප්‍රධාන පර්යේෂණ නිලධාරී / අංශ ප්‍රධානී
ඩී.පී.ඩබ්ලිව්.පොත්තවෙල මයා (කෘෂි විද්‍යාවේදී, පශවාත් උපාධි ඩිප්ලෝමා - ව්‍යා.ක)	-	තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී
ආර්.ඒ.පී.ඒ.රණතුංග මයා (කෘෂිකර්ම ඩිප්ලෝමා)	-	සංවර්ධන නිලධාරී
ඩබ්ලිව්.ජී.එම්.එස්.වීරගොඩ මයා (කෘෂි විද්‍යාවේදී , විද්‍යාපති)	-	සංවර්ධන නිලධාරී
එම්.කේ.පී.සී.ගුණවර්ධන මයා (කෘෂි විද්‍යාවේදී , විද්‍යාපති)	-	සංවර්ධන නිලධාරී
ඒ.පී.කරුණාතිලක මයා (කෘෂි විද්‍යාවේදී)	-	සංවර්ධන නිලධාරී
ඒ.එන්.එම්.කේ.ආර්.ප්‍රභාත් මයා (කෘෂි විද්‍යාවේදී)	-	සංවර්ධන නිලධාරී
කේ.පී.ජී.එස්.සඳනායක මයා (කෘෂිකර්ම ඩිප්ලෝමා)	-	තාක්ෂණ නිලධාරී
ඒ.පී.ජේ.මොහොට්ටි මයා	-	තාක්ෂණ නිලධාරී
ජී.සෝමවීර මයා	-	කළමණාකරණ සහකාර

විශේෂ ජයග්‍රහණයන්

තාක්ෂණ සම්ප්‍රේෂණ ක්‍රියාකාරකම්

ගොවීන්, ක්ෂේත්‍ර නිලධාරීන් සහ සිසුන් වෙනුවෙන් පවත්වන ලද පුහුණු වැඩසටහන් සහ ක්ෂේත්‍ර ආදර්ශනවල දී පහත සඳහන් තාක්ෂණික කරුණු සහ විෂය ක්ෂේත්‍ර ආවරණය කරන ලදී.

- ක්ෂේත්‍ර නිලධාරීන් **376** දෙනෙකු සඳහා නව උක් වගා තාක්ෂණයන් සම්බන්ධව පුහුණු වැඩසටහන් **13**ක් ද, ගොවීන් **1,130** දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් හා ක්ෂේත්‍ර ආදර්ශන **40**ක් ද පැවැත්වීම. මීට අමතරව, ක්ෂේත්‍ර නිරීක්ෂණ **240**ක් පවත්වමින් ගොවීන් දැනුවත් කරන ලදී. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, විශ්වවිද්‍යාල සහ කාර්මික විද්‍යාල සිසුන් **247** දෙනෙකුහට උක් වගාව සම්බන්ධ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
- සීනි කර්මාන්තශාලා ආශ්‍රිතව ක්ෂේත්‍ර ආදර්ශන **88**ක් සිටුවා පිහිටුවීම.
- බීජ උක් නිෂ්පාදනය සම්බන්ධ උපදෙස් පත්‍රිකාව පිටපත් **400**ක් සහ උක් පර්යේෂණ ආයතනීය පුවත් හසුන මුද්‍රණයකොට ප්‍රකාශයට පත් කිරීම.
- නිරිවගා පාලනය සම්බන්ධ මිනිත්තු **12**ක සහ අතුරු බෝග වගාව සම්බන්ධ මිනිත්තු **12**ක උපදේශාත්මක වීඩියෝ පට **2**ක් නිෂ්පාදනය කිරීම. මීට අමතරව, බීජ උක් නිපදවීම සම්බන්ධ වීඩියෝ පටයක් නිපදවීමේ මූලික කටයුතු සිදු කරන ලද අතර, ගුණාත්මක උක් නිෂ්පාදනය සම්බන්ධ වීඩියෝ පටය උක් පර්යේෂණ ආයතනීය නිල වෙබ් අඩවියට උඩුගත කරන ලදී.
- ගොවි අත්පොත, සහ උපදෙස් පත්‍රිකා පිටපත් **2,350**ක් ගොවීන් අතර බෙදා හැරීම.
- උක් ක්ෂේත්‍රයේ නියැලී සිටින, පර්යේෂකයින්, ව්‍යාප්ති නිලධාරීන් සහ ගොවීන් අතර ව්‍යාප්ති කරුණු හුවමාරු කරගැනීම පහසුවනු පිණිස SRI TTD e-SMS සේවාව ක්‍රියාත්මක කරන ලදී.

- **එස්. එල්. 83 06, එස්. එල්. අයි. 121, එස්. එල්. 89-1673, එස්. එල්. 90 6237, එස්. එල්. 92 4918, එස්. එල්. 92 4997, එස්. එල්. 92 5588, එස්. එල්. 95 4033, එස්. එල්. 95 4430, එස්. එල්. 95 4433, එස්. එල්. 96 128, එස්. එල්. 96 328, එස්. එල්. 98 2524, එස්. එල්. 00 95, එස්. එල්. 00 354, එස්. එල්. 00 603, එස්. එල්. 00 652, එස්. එල්. 00 624** උක් ප්‍රභේද ගොවීන් අතර ප්‍රචලිත කිරීම.

  - උක් පර්යේෂණ ආයතනය විසින් නිරදේශකර ඇති උක් ප්‍රභේද සියල්ලම අන්තර්ගතකොට ක්ෂේත්‍ර ආදර්ශනයක් පර්යේෂණ ගොවිපළෙහි ස්ථාපිත කිරීම.
  - **එස්.එල්. 00 603,** සහ **එස්. එල්. 96 128** ප්‍රභේදයන්ගේ ක්ෂේත්‍ර ආදර්ශන 3ක් පැල්වත්ත, සියඹලාණ්ඩුව සහ හිඟුරාණ ප්‍රදේශවල ස්ථාපිත කිරීම.

- පැල්වත්ත, සියඹලාණ්ඩුව, හිඟුරාණ සහ හඟුරන්කෙත ප්‍රදේශවල ගොවීන් **288** දෙනෙකු සඳහා ක්ෂේත්‍ර ආදර්ශන වැඩසටහන් **3**ක් සහ පුහුණු වැඩසටහන් **10**ක් පැවැත්වීම.
- සියඹලාණ්ඩුව, පැල්වත්ත, හිඟුරාණ, ඇතිමලේ සහ කණ්තලේ ප්‍රදේශවල ක්ෂේත්‍ර නිලධාරීන් **134** දෙනෙකු සඳහා නව උක් ප්‍රභේද සම්බන්ධව පුහුණු සැසි **7**ක් පැවැත්වීම.
- බුත්තල, සියඹලාණ්ඩුව සහ හිඟුරාණ ප්‍රදේශවල ක්ෂේත්‍ර නිරීක්ෂණ **42**ක් සිදු කිරීම.

- උක් වගාවේ යාන්ත්‍රීකරණය ප්‍රවර්ධනය කිරීම

  - පැල්වත්ත සහ හිඟුරාණ ප්‍රදේශවල ගොවීන් 275 දෙනෙකු සඳහා ගොවිපළ යාන්ත්‍රීකරණය සම්බන්ධ පුහුණු සැසි **08**ක් පැවැත්වීම.
  - ක්ෂේත්‍ර නිලධාරීන් **70** දෙනෙකු සඳහා යන්ත්‍ර සූත්‍ර භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන් **2**ක් උඩවලවේ දී පැවැත්වීම.
  - කුඩා පරිමාණ යන්ත්‍රෝපකරණ භාවිතය සම්බන්ධ ආදර්ශන **2**ක් හිඟුරාණේ දී පැවැත්වීම.
  - කුඩා පරිමාණ ගොවිපළ උපකරණ සම්බන්ධ උපදෙස් පත්‍රිකා 330ක් ක්ෂේත්‍ර නිලධාරීන් හා ගොවීන් අතර බෙදා හැරීම.

- උක් සමග අතුරු බෝග වගාව දිරි ගැන්වීම

  - පැල්වත්ත, සියඹලාණ්ඩුව සහ හිඟුරාණ ප්‍රදේශවල උක් සමග රටකජු සහ කව්පි අතුරු බෝග ලෙස වගා කිරීමේ ක්ෂේත්‍ර ආදර්ශන 67ක් ස්ථාපිතකොට නියාමනය කිරීම.
  - උඩවලව පර්යේෂණ ගොවිපළෙහි එක් ක්ෂේත්‍ර ආදර්ශනයක් ස්ථාපිත කිරීම.
  - සෙවනගල, පැල්වත්ත, සියඹලාණ්ඩුව සහ හිඟුරාණ ප්‍රදේශවල ගොවීන් 630දෙනෙකු සඳහා ආදර්ශන 4ක් සහ පුහුණු සැසි 21ක් පැවැත්වීම.
  - සියඹලාණ්ඩුව, පැල්වත්ත, හිඟුරාණ, ඇතිමලේ සහ කණ්තලේ ප්‍රදේශවල ක්ෂේත්‍ර නිලධාරීන් **317** දෙනෙකු සඳහා පුහුණු සැසි 12ක් පැවැත්වීම.
  - ආදර්ශන අතුරු බෝග වගාවන් ස්ථාපිත කරගැනීම සඳහා රටකජු කි. 220ක්, මුං බීජ කි. 9ක්, කව්පි කි. 30.5ක්, උඳු කි. 7ක් සහ කොමඩු සහ පිපිඤ්ඤා බීජ සුළු ප්‍රමාණවලින් ගොවීන් අතර බෙදා හැරීම.
  - ගොවීන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් අතර උපදෙස් පත්‍රිකා 250ක් බෙදා හැරීම.
  - අතුරු බෝග වගාව සම්බන්ධ වීඩියෝ පටයක් නිපදවීම.

- ගොවීන් අතර පාංශු සාරවත්බව කළමනාකරණය දිරි ගැන්වීම

  - පාංශු සාරවත්බව වැඩිදියුණු කිරීම සම්බන්ධ හෙක්. 1ක භූමි ප්‍රමාණයන්ගෙන් යුතු ක්ෂේත්‍ර ආදර්ශන 17ක් පැල්වත්ත ප්‍රදේශයේ ස්ථාපිත කිරීම.
  - සියඹලාණ්ඩුව, පැල්වත්ත, හිඟුරාණ සහ ඇතිමලේ ගොවීන් **513** දෙනෙකු සඳහා පාංශු සාරවත්බව කළමනාකරණය පිළිබඳ පුහුණු සැසි **19**ක් පැවැත්වීම.
  - සියඹලාණ්ඩුව, පැල්වත්ත, සහ හිඟුරාණ ප්‍රදේශවල ක්ෂේත්‍ර නිලධාරීන් 77 දෙනෙකු සඳහා පාංශු සාරවත්බව කළමනාකරණය පිළිබඳ පුහුණු සැසි 3ක් පැවැත්වීම.
  - පොහොර දැමීම සහ පාංශු සාරවත්බව කළමනාකරණය සම්බන්ධව ක්ෂේත්‍ර නිරීක්ෂණ **42**ක් හිඟුරාණ ප්‍රදේශයේ පැවැත්වීම.

- පරතරයක් ඇතිව සිටුවීමේ ක්‍රමය ප්‍රවලිත කිරීම

  - හිඟුරාණ ප්‍රදේශයේ ක්ෂේත්‍ර ආදර්ශන **2**ක් පැවැත්වීම.
  - සිටුවීමේ ක්‍රම පිළිබඳ පුහුණු සැසි **11**ක්, පැල්වත්ත, සියඹලාණ්ඩුව සහ හිඟුරාණ ප්‍රදේශවල ගොවීන් **335** දෙනෙකු වෙනුවෙන් පැවැත්වීම.
  - ක්ෂේත්‍ර නිලධාරීන් **70** දෙනෙකු සඳහා පුහුණු සැසි **2**ක් උඩවලවේ දී පැවැත්වීම.
  - සිටුවීමේ ක්‍රම සම්බන්ධ වීඩියෝ පටය සංස්කරණය කිරීම.

- හොඳම කළමනාකරණ ක්‍රම භාවිතය සම්බන්ධව ගොවීන්ගේ දැණුම ඉහළ නැංවීමෙන් උක්වල ගුණාත්මය ඉහළ නැංවීම

  - සියඹලාණ්ඩුව, පැල්වත්ත සහ හිඟුරාණ ගොවීන් **451** දෙනෙකු සඳහා හොඳම කළමනාකරණ ක්‍රම භාවිතයෙන් උක්වල ගුණාත්මය ඉහළ නැංවීම පිළිබඳ පුහුණු සැසි **15**ක් පැවැත්වීම.
  - පැල්වත්ත, හිඟුරාණ ක්ෂේත්‍ර නිලධාරීන් **129** දෙනෙකු සඳහා පුහුණු සැසි **8**ක් පැවැත්වීම.

- උක් ගුණාත්මය ඉහළ නැංවීම පිළිබඳ තොරතුරු පත්‍රිකාවෙහි පිටපත් **480**ක් ගොවීන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් අතර බෙදා හැරීම.
- උක් ගුණාත්මය ඉහළ නැංවීම පිළිබඳ වීඩියෝ පටය ආයතනීය වෙබ් අඩවියට උඩුගත කිරීම.

- **උක් ශාඛ්‍ය විද්‍යාත්මක ක්‍රම අනුවර්තනය දිරි ගැන්වීම**

  - පැල්වත්ත, සියඹලාණ්ඩුව සහ හිඟුරාණ ප්‍රදේශයන්හි ගොවීන් **796** දෙනෙකු සඳහා පුහුණු සහ ආදර්ශන සැසි **15**ක් පැවැත්වීම.
  - පැල්වත්ත, සියඹලාණ්ඩුව සහ හිඟුරාණ, කණ්තලේ සහ ඇතිමලේ ක්ෂේත්‍ර නිලධාරීන් **269** දෙනෙකු සඳහා පුහුණු සැසි **10**ක් පැවැත්වීම.
  - නිරි වගා පාලනය සම්බන්ධ උපදේශාත්මක වීඩියෝ පටයක් නිපදවීම සඳහා අදාළ රූගත කිරීම් සිදු කිරීම සහ ඒවා සංස්කරණය කිරීම.
  - තවාන් පාලනය පිළිබඳ තොරතුරු පත්‍රිකාවක් මුද්‍රණය කිරීම.
  - ගොවි අත්පොත් **280**ක්, වල් මර්දනය සහ නිරි වගා පාලනය සම්බන්ධ උපදෙස් පත්‍රිකා **950**ක් සහ පුවත් හසුන ගොවීන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් අතර බෙදා හැරීම.

- **රෝග හා පළිබෝධ කළමනාකරණය සම්බන්ධ දැනුම සහ අනුවර්තනය වැඩිදියුණු කිරීම**

  - පැල්වත්ත, සියඹලාණ්ඩුව, හඟුරන්කෙත සහ හිඟුරාණ ප්‍රදේශවල ගොවීන් **618** දෙනෙකු සඳහා රෝග හා පළිබෝධ පාලනය සම්බන්ධ පුහුණු වැඩසටහන් **16**ක් පැවැත්වීම.
  - සෙවනගල ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා රෝග පළිබෝධ පාලනය පිළිබඳ ක්ෂේත්‍ර ආදර්ශනයක් පැවැත්වීම.
  - පැල්වත්ත, සියඹලාණ්ඩුව සහ හිඟුරාණ, කණ්තලේ සහ ඇතිමලේ ප්‍රදේශවල ක්ෂේත්‍ර නිලධාරීන් **371** දෙනෙකු සඳහා පුහුණු/ආදර්ශන **13**ක් පැවැත්වීම.
  - පැල්වත්ත, සියඹලාණ්ඩුව සහ හිඟුරාණ ප්‍රදේශවල රෝග හා පළිබෝධ සම්බන්ධ ක්ෂේත්‍ර නිරීක්ෂණ **160**ක් පැවැත්වීම.
  - සුදු පත්‍ර හා කළු දුඹුලු රෝග, උක් වූල් කුඩිත්තා සහ කඳන් විදින පණුවා සම්බන්ධ උපදෙස් පත්‍රිකා **1,100**ක් ගොවීන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් අතර බෙදා හැරීම.

- **ගොවීන්ගේ ව්‍යවසායකත්ව කුසලතාවයන් වැඩිදියුණු කිරීම**

  - පැල්වත්ත, සියඹලාණ්ඩුව සහ හාලිඇල ප්‍රදේශවල ගොවීන් සහ තරුණයින් සඳහා පුහුණු සැසි **5**ක් පැවැත්වීම.

- **සීනි සමාගම් සහ අනෙකුත් ආයතනවල ඉල්ලීම පරිදි ඉටුකරන පුහුණු/සේවා, ප්‍රදර්ශනවලට සහභාගී වීම සහ වෙනත් කටයුතු**

  - **2017** වාර්ෂික වාර්තාව මුද්‍රණයට පිළියෙල කිරීම.
  - බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ සහ රජරට විශ්වවිද්‍යාලයේ පැවති ප්‍රදර්ශන **2**කට සහභාගී වීම.
  - සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුබද්ධ නිලධාරීන් **24** දෙනෙකු සඳහා උක් හකුරු නිපදවීම සම්බන්ධ පුහුණු වැඩසටහනක් උඩවලවේ දී පැවැත්වීම.
  - රුහුණ, කොළඹ (හම්බන්තොට ඒකකය) සහ පේරාදෙණිය විශ්වවිද්‍යාල සිසුන් **190** දෙනෙකු සඳහා පුහුණු සැසි **3**ක් පැවැත්වීමට සම්බන්ධීකරණය කිරීම.
  - මොණරාගල ජාතික තරුණ සේවා සභාවේ සහ කාර්මික විද්‍යාලයේ සිසුන් හා මොණරාගල, සෙවනගල සහ කොළඹගෙඅාර පාසල්වල සිසුන් **97** දෙනෙකු සඳහා පුහුණු සැසි **9**ක් පැවැත්වීම.
  - ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් පවත්වන වැවිලි ව්‍යාප්ති කළමනාකරණය සම්බන්ධ ඩිප්ලෝමා පාඨමාලාවේ උක් මොඩියුලයෙහි ප්‍රායෝගික ක්‍රියාකරම් පැවැත්වීම.
  - ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් පවත්වන වැවිලි කළමනාකරණය ඩිප්ලෝමා පාඨමාලාවේ උක් මොඩියුලය උඩවලවේ දී පැවැත්වීම.
  - ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් පවත්වන වැවිලි ව්‍යාප්ති කළමනාකරණය සම්බන්ධ ඩිප්ලෝමා පාඨමාලාවෙහි ප්‍රමිතීන්, සහ විෂය නිර්දේශය සැකසීමට සහය වීම.
  - බදුල්ල, බුත්තල සහ මොණරාගල දිස්ත්‍රික් සම්බන්ධීකරන සහ ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවලට සහභාගී වීම.
  - ජාතික වැවිලි කළමනාකරණ ආයතනය සහ ඇක්වයිනාස් විද්‍යාලයේ සිසුන් සඳහා උක් කර්මාන්තය සම්බන්ධ හැඳින්වීමක් සහ බෝග කළමනාකරණ සම්බන්ධ දේශන පැවැත්වීම.

සංවර්ධන

- උක් කර්මාන්ත සංවර්ධන වැඩසටහන

බදුල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්ක

- හඟුරන්කෙත ප්‍රදේශයේ හෙ. 0.5ක තවාන් නියාමනය සහ අස්වනු නෙළීම.
- හඟුරන්කෙත ප්‍රදේශයේ ගොවි පවුල් 320ක් අතර කුඩා පරිමාණ උක් ගෙවතු වගා ලෙස ආරම්භ කිරීමට අවශ්‍ය බීජ උක් බෙදා හැරීම.
- හඟුරන්කෙත ප්‍රදේශයේ ක්ෂේත්‍ර නිලධාරීන් 80 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- හඟුරන්කෙත ප්‍රදේශයේ ක්ෂේත්‍ර සහායකයින් සඳහා උක් හකුරු නිපදවීම සම්බන්ධ දෙදින පුහුණු වැඩසටහනක් උක් පර්යේෂණ ආයතනයේ දී පැවැත්වීම.
- හඟුරන්කෙත සහ කොත්මලේ ප්‍රදේශවල ගොවීන් 694 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 14ක් පැවැත්වීම.
- හඟුරන්කෙත ප්‍රදේශයේ ගොවීන් සඳහා හකුරු නිපදවීම සම්බන්ධ ක්ෂේත්‍ර ආදර්ශන 5ක් පැවැත්වීම.
- බදුල්ල දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවලට සහභාගී වීම.

- **සෙවනගල, පැල්වත්ත සහ හිඟුරාණ ප්‍රදේශවල උක් වගාවේ සුදු පත්‍ර රෝගය පාලනය කිරීම (2017-2020)**

  - උඩවලව, සෙවනගල, පැල්වත්ත, කණ්තලේ සහ හිඟුරාණ ප්‍රදේශවල හෙක්. 40.5ක ප්‍රාථමික තවාන් ස්ථාපිත කිරීම.
  - උණු දිය ප්‍රතිකාර කරන ලද බීජ උක් ටොන් 475ක් කර්මාන්තශාලා අතර බෙදා හැරීම.
  - ගොවීන් සහ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 18ක් පැවැත්වීම.
  - කර්මාන්තශාලා අතර බෙදා හැරීම සඳහා ග්ලයිෆොසේට් ලීටර 31,815ක් මිලදී ගැනීමට අනුමැතිය ලබා ගැනීම.

ප්‍රකාශන සහ ප්‍රදානයන්

ප්‍රකාශන

- කේ. එම්. ජී. වංචලා, වී. කේ. ඒ. එස්. එම්. වනසිංහ, කේ. එස්. හේමචන්ද්‍ර, එස්. නුගලියද්ද සහ ඩබ්ලිව්. ආර්. ජී. විතාරම (2019). සුදු පත්‍ර රෝග වාහක කෘමියාගේ (*ඩෙල්ටොසෙෆලස් මෙනෝනි* - හෙමිප්ටෙරා:සිකඩෙලිඩේ) හැසිරීම් රටාවන් සඳහා පත්‍ර මත ඇති ඉටි ප්‍රමාණයේ බලපෑම. වාර්තා සටහන, 31වන වාර්ෂික පර්යේෂණ සම්මණ්ත්‍රණය, කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයය. පිටු 32.

- කේ. එම්. ජී. වංචලා, එස්. එම්. කිරිඇල්ල, වී. කේ. ඒ. එස්. එම්. වනසිංහ, කේ. එස්. හේමචන්ද්‍ර, එස්. නුගලියද්ද, ඩබ්ලිව්. ආර්. ජී. විතාරම (2019). උක් වගාවේ සුදු පත්‍ර රෝගයට ප්‍රතිරෝධී ප්‍රභේද අධ්‍යයනය කිරීම සඳහා එම ප්‍රභේද මත වාහක කෘමියාගේ (*ඩෙල්ටොසෙෆලස් මෙනෝනි* - හෙමිප්ටෙරා:සිකඩෙලිඩේ) ක්‍රියාකාරිත්වය සැලකිල්ලට ගැනීමට ඇති විභවය. වාර්තා සටහන, 7වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය [ICSUSL – 2019, 2019 නොවැම්බර් 14-15] පිටු 187.

- වී. කේ. ඒ. එස්. එම්. වනසිංහ, කේ. එම්. ජී. වංචලා, ඩබ්ලිව්. ජී. එම්. එස්. වේරගොඩ සහ එස්. නුගලියද්ද (2019). අම්පාර දිස්ත්‍රික්කයේ උක් කඳන් විදින පණුවාගේ ගහනය පාලනය කිරීම සඳහා කෘමි නාශකවල ඇති විභවය සහ කීට පරපෝෂිතයෙකුවන *කොටෙෂියා ෆ්ලැවිපිස්* (හෙමිප්ටෙරා:බ්‍රැකොනිඩේ) ගේ අවශ්‍යතාවය අධ්‍යයනය කිරීම. වාර්තා සටහන, "වැවිලි ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනය උදෙසා 7වන වැවිලි බෛග සමුළුව" - පී. එච්. එල්. රොඩ්‍රිගෝ, බී. ඩබ්ලිව්. විජේසූරිය, ඩී. පී. එදිරිසිංහ, එන්. එම්. සී. නයනකාන්ත (සංස්කරණය) ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය, ඩාර්ටන් ෆීල්ඩ්, අගලවත්ත, 12200, ශ්‍රී ලංකාව. පිටු 145-152.

- කේ. එම්. ජී. වංචලා, වයි. පී. කේ. දයාසේන, වී. කේ. ඒ. එස්. එම්. වනසිංහ, කේ. එස්. හේමචන්ද්‍ර, එස්. නුගලියද්ද, ඩබ්ලිව්. ආර්. ජී. විතාරම (2019). සුදු පත්‍ර රෝග වාහකයාගේ (*ඩෙල්ටොසෙෆලස් මෙනෝනි* - හෙමිප්ටෙරා:සිකඩෙලිඩේ) ව්‍යාධි ජනන හැකියාව. වාර්තා සටහන, "වැවිලි ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනය උදෙසා 7වන වැවිලි බෛග සමුළුව" - පී. එච්. එල්. රොඩ්‍රිගෝ, බී. ඩබ්ලිව්. විජේසූරිය, ඩී. පී. එදිරිසිංහ, එන්. එම්. සී. නයනකාන්ත (සංස්කරණය) ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය, ඩාර්ටන් ෆීල්ඩ්, අගලවත්ත, 12200, ශ්‍රී ලංකාව. පිටු 153-162.

- වී. කේ. ඒ. එස්. එම්. වනසිංහ, කේ. එම්. ජී. වංචලා, ඒ. පී. කරුණාකිලක, ඒ. නික්පේ, සහ එස්. නුගලියද්ද (2019). ශ්‍රී ලංකාවේ උක් වගාවන් තුළ ඡේනා දළඹුවාගේ (*ස්පොඩොප්ටෙරා ෆ්රුජිපර්ඩා* - ලෙපිඩොප්ටෙරා:නොක්ටුඒඩ්) ව්‍යාප්තිය පිළිබඳ ප්‍රථම පර්යේෂණය. වාර්තා සටහන, සීනි සහ උක් පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය, කායිලන්නය. පිටු 39.

- කේ. එම්. ජී. වංචලා, වයි. එස්. එම්. කිරිඇල්ල, වී. කේ. ඒ. එස්. එම්. වනසිංහ, කේ. එස්. හේමචන්ද්‍ර, එස්. නුගලියද්ද, ඩබ්ලිව්. ආර්. ජී. විතාරම (2019). පත්‍ර තලයේ වර්ණය, සුදු පත්‍ර රෝග වාහක කෘමියාගේ (*ඩෙල්ටොසෙෆලස් මෙනෝනි* - හෙමිප්ටෙරා:සිකඩෙලිඩේ) වර්යා රටාවන් මත බලපෑම් ඇති කරන්නනේ ද? වාර්තා සටහන, සීනි සහ උක් පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය, කායිලන්නය. පිටු 27.

- වී. කේ. ඒ. එස්. එම්. වනසිංහ, කේ. එම්. ජී. වංචලා, එම්. කේ. පී. සී. ගුණවර්ධන සහ ඒ. විජේසූරිය (2019). කණ්තලේ උක් කවාන්වල උක් පත්‍ර කීඩැවා, *පයිරිල්ලා පසියුසිල්ලා, එපිරිකානියා මෙලනලූකා* යොදාගනිමින් මර්දනය කිරීම. වාර්තා සටහන, සුගර්කොන් ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව, අයි. සී. ඒ. ආර් - ඉන්දියානු උක් පර්යේෂණ ආයතනය. පිටු 119.

- කේ. එම්. ජී. වංචලා සහ වී. කේ. ඒ. එස්. එම්. වනසිංහ (2019). උක් සුදුපත්‍ර රෝග වාහකයාවන *ඩෙල්ටොසෙපල්ස් මෙනෝනි* මර්දනය සඳහා කෘමිනාශක යෙදීමට සුදුසු වේලාව නිර්ණය කිරීම. වාර්තා සටහන, සුගර්කොන් ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව, අයි. සී. ඒ. ආර් - ඉන්දියානු උක් පර්යේෂණ ආයතනය. පිටු 192.

- ඒ. එන්. ඩබ්ලිව්. එස්. තුෂාරී, ජී. ඩී. එන්. මැණිකේ, එන්. ඩී. විජේසූරිය සහ වයි. ඒ. පී. කේ. දයාසේන (2019). උක් ශාකයේ පත්‍ර කහ වීමේ සහලක්ෂණයට හේතුවන ෆයිටොප්ලාස්මාවන් පවතින බව අණුක ජීව විද්‍යාත්මකව හඳුනාගැනීම සහ එහි වංශ ප්‍රවේණිය සුදු පත්‍ර රෝගය සාදන ෆයිටොප්ලාස්මාවට ඇති සම්බන්ධය හඳුනා ගැනීම. වාර්තා සටහන, සීනි සහ උක් පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය, කායිලන්නය. පිටු 28.

- ඒ. එන්. ඩබ්ලිව්. එස්. තුෂාරී සහ බී. ඩී. එස්. කේ. ආරියවංශ (2019). තෝරාගත් උක් වර්ග කිහිපයක් උක් වගාවේ කළු දුඹුලු රෝගයට දක්වන ප්‍රතික්‍රියාව ඇගයීම සහ එම රෝගය උක් සීනි සහ උක් දඬු අස්වැන්නට දක්වන

සම්බන්ධකම් අධ්‍යයනය කිරීම. වාර්තා සටහන, "වැවිලි ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනය උදෙසා 7වන වැවිලි බෝග සමුළුව" - පී. එච්. එල්. රොඩ්‍රිගෝ, බී. ඩබ්ලිව්. විජේසූරිය, ඩී. පී. එදිරිසිංහ, එන්. එම්. සී. නයනකාන්ත (සංස්කරණය) ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය, ඩාර්ටන් හිල්ඩ්, අගලවත්ත, 12200, ශ්‍රී ලංකාව. පිටු 163-165.

- එම්. එම්. ඕ. එන්. නවරත්න, යූ. එම්. ඒ. කුමාර, ඒ. එන්. ඩබ්ලිව්. එස්. තුෂාරී සහ ඩී. එම්. ද කොස්තා (2019). ශ්‍රී ලංකාවේ උක් වගාවේ සුදු පත්‍ර රෝගය හඳුනා ගැනීම සඳහා ඩී. එන්. ඒ. ප්‍රෝබයක් නිපදවීම. වාර්තා සටහන, උපාධි අපේක්ෂකයන්ගේ පර්යේෂණ සම්මන්ත්‍රණය, කෘෂි විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය. පිටු 94.

- එන්. ජී. එච්. එම්. ධර්මසේන, ඒ. එන්. ඩබ්ලිව්. එස්. තුෂාරී සහ ඩී. එම්. ද කොස්තා (2019). ශ්‍රී ලංකාවේ උක් වගාවේ සුදු පත්‍ර රෝගය ඇතිකරන ෆයිටොප්ලාස්මාවේ ප්‍රවේණි විවිධත්වය අධ්‍යයනය කිරීම. වාර්තා සටහන, උපාධි අපේක්ෂකයන්ගේ පර්යේෂණ සම්මන්ත්‍රණය, කෘෂි විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය. පිටු 111.

- ආර්. එම්. එම්. කේ. රත්නායක, ඒ. එන්. ඩබ්ලිව්. එස්. තුෂාරී සහ ඩී. එම්. ද කොස්තා (2019). උක් වගාවේ කළු දුඹුලු රෝගයට හේතුවන දිලීරය මර්දනය කිරීමට උක් ශාකය තුළ සිටින ක්ෂුද්‍ර ජීවීන් යොදා ගැනීමේ විභවය පරීක්ෂා කිරීම. වාර්තා සටහන, උපාධි අපේක්ෂකයන්ගේ පර්යේෂණ සම්මන්ත්‍රණය, කෘෂි විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය. පිටු 121.

- බී. එම්. එන්. ජේ. බස්නායක, ඒ. එන්. ඩබ්ලිව්. එස්. තුෂාරී සහ ඩී. එම්. ද කොස්තා (2019). විවිධ පොහොර මට්ටම් අනුව උක් වගාවේ උක් වගාවේ සුදු පත්‍ර රෝගකාරක ෆයිටොප්ලාස්මාව වෙනස්වන ආකාරය අණුක ජීව විද්‍යාත්මක ක්‍රම මගින් ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව හඳුනා ගැනීම. වාර්තා සටහන, උපාධි අපේක්ෂකයන්ගේ පර්යේෂණ සම්මන්ත්‍රණය, කෘෂි විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය. පිටු 88.

- වයි. ඒ. පී. කේ. දයාසේන, ඒ. එන්. ඩබ්ලිව්. එස්. තුෂාරී සහ ඒ. විජේසූරිය (2019). උක් වගාවේ පත්‍ර ප්‍රදාහ රෝග කාරක බැක්ටීරියාව හඳුනාගැනීම සඳහා අණුක ජීව විද්‍යාත්මක ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම සහ ලංකාවේ පත්‍ර ප්‍රදාහ රෝගයට බලපාන රෝග කාරකයාගේ ප්‍රභේද හඳුනා ගැනීම. වාර්තා සටහන, හත්වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, බෙලිහුල්ඔය, ශ්‍රී ලංකාව. පිටු 172-173.

- ඒ. එල්. සී. ද සිල්වා, ඩබ්. ඒ. ජේ. එම් කොස්තා, සහ එච්.ඒ.කේ.එන්.එන්. සේනාරත්න (2019). වායුගෝලීය ඉහළ උෂ්ණත්වයක් හා ඉහළ කාබන්ඩයොක්සයිඩ් තත්ව යටතේ උක් ප්‍රභේදයන්හි මූලික වර්ධන අවධියේ දී ප්‍රභාසංස්ලේෂණය හා උත්ස්වේදන කාර්යක්ෂමතාවයේ විචලනය. ඒ. චන්ද්‍රා, එම්. ස්වජ්නා, ආර්. මනිමේකලෙයි, පී.සිං, ඒ.කේ. තිවාරි, සහ ජී.ජී. රානි සංස්කරණය පිටු 99. ෂුගර් කෝන් - 2017 ජාත්‍යන්තර සමුළුවේ ක්‍රියා පරිපාටිකරය සීනි සහ ඒකාබද්ධ කර්මාන්තවල තිරසාර සංවර්ධනය සඳහා හරිත තාක්ෂණය අයි.පී.ඒ.ආර්. ඉන්දියානු උක් පර්යේෂණ ආයතනය, ලක්නව්, උත්තර ප්‍රදේශය, ඉන්දියාව.

- එල්.එම්.ජේ.ආර්. විජයවර්ධන, ඒ.එල්.සී.ද සිල්වා, බී.ආර්. කුලසේකර, ඩබ්.ආර්.ජී. විතාරම සහ එම්.ජී.එන්.එස්.සී. බණ්ඩාර (2019). හිඟුරාණ ප්‍රදේශයේ උක් වගාවන්හි උක් අස්වැන්න හා ඒ දර්ශනයේ ජල භූමිතික පරාමිතික අතර සම්බන්ධතාව. හත් වන වැවිලි බෝග පර්යේෂණ සම්මන්ත්‍රණ වාර්තාව. "වැවිලි අංශයේ තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා"ආචාර්ය වී. එම්. රොඩ්රිගෝ, ආචාර්ය පී.ඩබ්. විජේසූරිය, ආචාර්ය සී.ජී. එදිරිසිංහ, ආචාර්ය එන්.එම්. සී. නයනකාන්ත සංස්කරණය පිටු 59-66, රබර් පර්යේෂණ ආයතනය, ඩාර්ටන් හිල්ඩ්, අගලවත්ත, ශ්‍රී ලංකාව.

- එච්.ජී.සී.එස්.එච්. ජයසිංහ, ඒ.එම්.එම්.එස්. පෙරේරා, සහ ජී. තිරුකුමාරන්, උක් රේඛීය විවිත්‍ර වෛරස රෝගය සඳහා ශ්‍රී ලංකාවේ උක් ජාන ප්ලාස්මය හා නිරෝධායන මධ්‍යස්ථානයේ වර්ග පරීක්ෂා කිරීම (2019). වියළි කලාපීය කෘෂිකර්මාන්තය පිළිබඳ 5 වන ජාත්‍යන්තර සමුළුව, කෘෂි විද්‍යා පීඨය, යාපනය විශ්වවිද්‍යාලය (පිටු අංක 76).

- කේ.පී. වික්‍රමසිංහ, ඒ. විජේසූරිය, බී.ඩී.එස්.කේ. ආරියවංශ, ඒ.එම්.එම්.එස්. පෙරේරා, කේ.එම්.ජී. වංචලා, ඩී. මානෙල් සහ ආර්.ඒ.එම්. වන්දන (2019). පැල්වත්ත ප්‍රදේශයේ සුදු පත්‍ර රෝගයට හිතැති පරිසරයේ දී උක් ප්‍රභේදවල ක්‍රියාකාරිත්වය. 7 වන වැවිලි බෝග පර්යේෂණ සම්මන්ත්‍රණය, මරිනෝ බීච් හෝටලය, කොළඹ (පිටු අංක 19-31)

- ඒ.එම්.එම්.එස්. පෙරේරා, ඩී.පී.එස්.ටී.ජී. අත්තනායක සහ ඒ. විජේසූරිය (2019). කිසියම් කාරණ ජනගහණයක් තැනීම සඳහා SSR සලකුණු භාවිතා කරමින් සැකරුම් ඔපිසිනාරුම් සහ සැකරුම් ස්පෝන්ටෙනියම් දෙමාපිය සංයෝජන සහ දරු පරම්පරාව හඳුනා ගැනීම

- එච්.වී.ඒ.එස්. කෝෂිලා, ඒ. වීජේසූරිය, කේ.කේ.ජී.යූ. හේමමාලි සහ ඒ.එම්. එම්.එස්. පෙරේරා (2019). උක් බෝග වැඩිදියුණු කිරීමේදී අන්තර් විශේෂිත දෙමුහුම් ප්‍රභවයන් හඳුනා ගැනීම. රුහුණු 6 වන ජාත්‍යන්තර විද්‍යා හා තාක්ෂණ සම්මන්ත්‍රණය, විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර. (පිටු අංක 4)

- ආරියවංශ බී.ඩී.එස්.කේ., අබේනායක එන්.ආර්., සිවානන්දවර්ල් ටී.(2019) "අනාවරණය නොවූ සංරචක අඩංගු ආකෘතියක් භාවිතයෙන් ශ්‍රී ලංකාවේ උක් නිෂ්පාදනය පුරෝකථනය කිරීම". කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ 31 වන වාර්ෂික පර්යේෂණ ඉදිරිපත් කිරීමේ සැසිය.

ප්‍රදානයන්

- පර්යේෂණ නිලධාරී වී. කේ. ඒ. එස්. එම්. වනසිංහ විසින් ඉන්දියාවේ පැවති ෂුගර්කොන්-2019 ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ දී ඉදිරිපත් කරන ලද "කණ්තලේ උක් තවාන්වල උක් පත්‍ර කීඩැවා, පයිරිල්ලා පපියුසිල්ලා සහ එපිරිකානියා මෙලනොලුකා යොදාගනිමින් මර්දනය කිරීම සඳහා එපිරිකානියා මෙලනොලුකා යොදා ගැනීම" යන පර්යේෂණයට, වාචික ඉදිරිපත් කිරීම් යටතේ දෙවන ස්ථානය හිමිවිය.

- පර්යේෂණ නිලධාරී කේ. එම්. ජී. වංචලා විසින් ඉන්දියාවේ පැවති ෂුගර්කොන්-2019 ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ දී ඉදිරිපත් කරන ලද "උක් සුදුපත්‍ර රෝග වාහකයාවන ඩෙල්ටොසෙපල්ස් මෙනෝනි මර්දනය සඳහා කෘමිනාශක යෙදීමට සුදුසු වේලාව නිර්ණය කිරීම" යන පර්යේෂණ පත්‍රිකාවට පෝස්ටර් ඉදිරිපත් කිරීම් යටතේ ප්‍රථම ස්ථානය හිමිවිය.

- 2019 පෙබරවාරි 16 - 19 දිනවල ඉන්දියාවේ උත්තර් ප්‍රදේශයේ, ලක්නව් හි ඉන්දියානු උක් පර්යේෂණ ආයතනයේ පැවති "සීනි සහ ඒකාබද්ධ කර්මාන්තවල තිරසාර සංවර්ධනය සඳහා හරිත තාක්ෂණයන්" යන තේමා යටතේ පැවති ෂුගර්කෝන්-2019 අන්තර්ජාතික සමුළුවේදී සීනි බෝග හා කර්මාන්ත සඳහා කැපීපෙනෙන දායකත්වයක් වෙනුවෙන් වන විශිෂ්ඨතා සම්මානය ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඒ. එල්. සී. ද සිල්වා මහතාට පිරිනැමිණි.

- 2019 පෙබරවාරි 16 - 19 දිනවල ඉන්දියාවේ උත්තර් ප්‍රදේශයේ, ලක්නව් හි ඉන්දියානු උක් පර්යේෂණ ආයතනයේ පැවති "සීනි සහ ඒකාබද්ධ කර්මාන්තවල තිරසාර සංවර්ධනය සඳහා හරිත තාක්ෂණයන්" යන තේමා යටතේ පැවති ෂුගර්කෝන්-2019 අන්තර්ජාතික සමුළුවේදී, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඒ. එල්. සී. ද සිල්වා මහතා "වඩා හොඳ ප්‍රතිලාභයක් සඳහා ආතති පරිසර පද්ධතිය සහ වැඩිදියුණුකළ බෝග නිෂ්පාදනය" ඉදිරිපත් කිරීම වෙනුවෙන් සමගාමී සැසියේ සී iii කොටසේ ප්‍රධාන පත්‍රිකාව සහ ගෞරවනීය කථිකයා ලෙස සම්මාන ලැබීය.

- 2019 වර්ෂයේ පවත්වන ලද 7 වන වැවිලි භෝග පර්යේෂණ සැසියේ විශිෂ්ඨතම පර්යේෂණ පත්‍රිකාව සඳහා හිමි සම්මානය "පැල්වත්ත ප්‍රදේශයේ සුදු පත්‍ර රෝගයට පාත්‍රී පරිසර තත්ත්ව යටතේ උක් ප්‍රභේදවල කාර්යසාදනය" යන මාතෘකාව යටතේ වූ පර්යේෂණ පත්‍රිකාව සඳහා දිනා ගන්නා ලදි. එහි කතෘත්වය කේ.ජී.වික්‍රමසිංහ, ඒ.වීජේසූරිය, බී.ඩී.එස්.කේ. ආරියවංශ, ඒ.එම්.එම්.එස්. පෙරේරා, කේ.එම්.ජී.වංචලා, ඩී.මානෙල් සහ ආර්.ඒ.එම්.චන්දන යන අය විසින් දරණ ලදි.

- 2019 වර්ෂයේ පවත්වන ලද 7 වන වැවිලි භෝග පර්යේෂණ සැසියේ උක් ක්ෂේත්‍රය යටතේ හොඳම පර්යේෂණ ඉදිරිපත් කිරීමට අදාළ සම්මානය කේ.ජී.වික්‍රමසිංහ මහතා විසින් දිනා ගන්නා ලදි. අදාළ පර්යේෂණ පත්‍රිකාව "පැල්වත්ත ප්‍රදේශයේ සුදු පත්‍ර රෝගයට පාත්‍රී පරිසර තත්ත්ව යටතේ උක් ප්‍රභේදවල කාර්යසාදනය" යන මාතෘකාව යටතේ වූ අතර එහි කතෘත්වය කේ.ජී.වික්‍රමසිංහ, ඒ.වීජේසූරිය, බී.ඩී.එස්.කේ.ආරියවංශ, ඒ.එම්.එම්.එස්.පෙරේරා, කේ.එම්.ජී. වංචලා, ඩී. මානෙල් සහ ආර්.ඒ.එම්. චන්දන යන අය විසින් දරණ ලදි.

- 2019 වර්ෂයේ පවත්වන ලද 7 වන වැවිලි භෝග පර්යේෂණ සැසියේ උක් ක්ෂේත්‍රය යටතේ හොඳම පර්යේෂණ පත්‍රිකාවට අදාළ සම්මානය "තෝරාගත් උක් ප්‍රභේද කිහිපයක් කළු දුඹුළු රෝගය සඳහා දක්වන ප්‍රතික්‍රියාව හා එමඟින් උක් හා සීනි අස්වනු සංරචක සඳහා ඇතිවන බලපෑම" යන මාතෘකාව යටතේවූ පත්‍රිකාවට හිමි විය. එහි කතෘත්වය ඒ.එන්.ඩබ්.එස්. තුෂාරි සහ බී.ඩී.එස්.කේ. ආරියවංශ යන අය විසින් දරණ ලදි.

මූල්‍ය කළමනාකරණය

පාලන හා ගිණුම් අංශය

කාර්ය මණ්ඩලය

ආචාර්ය ඒ.පී. කීර්තිපාල මහතා (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති, දර්ශනශූරී)	-	අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී (2019.07.13 දක්වා)
ආචාර්ය අරුණ විජේසූරිය (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති, දර්ශනශූරී)	- -	අධ්‍යක්ෂ (වැ.ඛ.) නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)
ඒ.එන්.පී. පෙරේරා මිය (විද්‍යාපති, එම්බීඒ, බීබීඒ, සිමා, ඩිප්.එම්ඒ, එම්අයිපිසී, සීබීඒ)	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) (2019.06.17 දින සිට)

පාලන අංශය

පී.කේ.එන්. ප්‍රියදර්ශන මහතා විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ), සී.බී.ඒ	-	සහකාර අධ්‍යක්ෂ (පාලන)
ආචාර්ය සී. එපිටවල මහතා (දර්ශනශූරී)	-	පරිපාලන නිලධාරී
ටී.ඒ.ඩී.එම්.ජී. ජයතිලක මිය	-	කළමනාකාරණ සහකාර (ලිපිකරු සහ යතුරුලියනය)
ජේ.කේ. චන්ද්‍රලතා මිය	-	කළමනාකාරණ සහකාර (ලිපිකරු සහ යතුරුලියනය)
ටී.එම්.කේ. සේනාධීර මිය	-	කළමනාකාරණ සහකාර (ලිපිකරු සහ යතුරුලියනය)
එම්.එම්.අයි.එම්.කේ. මැණික්කඩවර මෙනවිය	-	කළමනාකාරණ සහකාර (ලිපිකරු සහ යතුරුලියනය)
එම්.ඒ.ආර්. සමරසේකර මෙනවිය	-	කළමනාකාරණ සහකාර (ලිපිකරු සහ යතුරුලියනය)
ඕ.යූ. සුභසිංහ මිය	-	කළමනාකාරණ සහකාර (ලිපිකරු සහ යතුරුලියනය)
ඩබ්.ඒ.එස්. මධුශංක මහතා	-	කළමනාකාරණ සහකාර (ලිපිකරු සහ යතුරුලියනය)
ඒ.කේ. රත්නායක මිය	-	දුරකථන ක්‍රියාකරු/පිළිගැනීමේ නිලධාරී
ඔස්ටින් පෙරේරා මහතා	-	රියදුරු
එස්.එල්. පීරිස් මහතා	-	රියදුරු
එච්.ඒ.යූ.එස්. ජේමරත්න මහතා	-	රියදුරු
ජේ.පී.එස්.පී. කරුණාතිලක මහතා	-	රියදුරු
ටී.පී.කේ. ජයරත්න මහතා	-	රියදුරු
එස්. ඒකනායක මහතා	-	රියදුරු
එච්.එස්.ඒ. සුසන්ත කුමාර මහතා	-	රියදුරු
ජී.ඩබ්ලිව්.එම්.පී. ප්‍රභාත් සංජීව මහතා	-	රියදුරු
ඒ.එම්. විජේරත්න බණ්ඩා මහතා	-	රියදුරු
ඩබ්.එම්.ඒ.කේ. ප්‍රියශාන්ත මහතා	-	රියදුරු
කේ.ඩී. මංජුල අබේසිරි මහතා	-	රියදුරු
එච්.එම්.ඒ.එස්.කේ. හේරත් මහතා	-	රියදුරු

නඩත්තු ඒකකය

ජී.එස්.කේ. දහනායක මහතා (විද්‍යාවේදී)	-	වැඩ අධිකාරී
ඩී.එච්.එස්. විජේසිංහ මිය	-	වැඩ පරීක්ෂක
ජී. ගමගේ මහතා	-	විදුලි කාර්මික
ආර්. පාලමුරේ මහතා	-	විදුලි කාර්මික
ඩී.ඩබ්ලිව්.එස්. චින්තන මහතා	-	වඩු කාර්මික
ආර්.පී. කුලතුංග මහතා	-	වඩු කාර්මික
එච්.පී. චන්ද්‍රවංශ මහතා	-	ජල පොම්ප ක්‍රියාකරු
කේ.එච්. වීරරත්න මහතා	-	ජල පොම්ප ක්‍රියාකරු

ගිණුම් අංශය

ඩී.එම්.ජේ.එන්. දිසානායක මිය (වාණිජවේදී, විද්‍යාපති)	-	ගණකාධිකාරී
අයි.බී. කෝදාගොඩ (වාණිජවේදී)	-	ගිණුම් නිලධාරී
ටී.එම්.එල්.එස්. තෙන්නකෝන් මහතා	-	පොත් තබන්නා
ජී.එම්.එස්. නන්දදේව මහතා	-	ජ්‍යෙෂ්ඨ කළමනාකාරණ සහකාර (ගිණුම්)
ඒ.කේ. අමරකෝන් මිය	-	ජ්‍යෙෂ්ඨ කළමනාකාරණ සහකාර (ගිණුම්)
ඩී.එම්.පී. නික්ෂන් මහතා	-	ජ්‍යෙෂ්ඨ කළමනාකාරණ සහකාර (ගිණුම්)
එස්.එස්. වතුරුනී මිය	-	කළමනාකාරණ සහකාර (ගිණුම්)
ජී.ඩී.එන්.එම්. අනුරුද්ධිකා මිය	-	කළමනාකරණ සහකාර (ගිණුම්)

ප්‍රසම්පාදන ඒකකය

එල්.එස්. දයානන්ද මහතා	-	ජ්‍යෙෂ්ඨ කළමනාකාරණ සහකාර (ගිණුම්)
ඒ.ජී.යූ.එස්. ද සිල්වා මහතා	-	කළමනාකාරණ සහකාර (ගිණුම්)
ටී.එස්. වීරසිංහ මෙනවිය	-	කළමනාකරණ සහකාර (ගිණුම්)

ගබඩාව

ආර්.ජී . නිරෝෂන මහතා	-	ගබඩා භාරකරු
ටී. රංජිත් පීරිස් මහතා	-	කළමනාකාරණ සහකාර (ගිණුම්)

අභ්‍යන්තර විගණන ඒකකය

එස්.පී.වයි. මුනීන්ද්‍ර මහතා අයි.සී.ඒ (අන්තර්මාධ්‍ය) එම්.ඒ.ඒ.ටී.	-	අභ්‍යන්තර විගණක

වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යන්හි සාරාංශය

- පුරප්පාඩු දොළහක් පිරවීම; නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ හා තාක්ෂණ භූවමාරු), නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන), පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙක්, සංවර්ධන නිලධාරියෙක්, තාක්ෂණ නිලධාරීන් තිදෙනෙක්, කළමනාකරණ සහකාර (ගිණුම්) තනතුරක් සහ පොදු කම්කරුවන් තිදෙනෙක්
- **2019** අගෝස්තු මස **1** වන දින සිට සිවිල් ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවෙන් ආරක්ෂක සේවා ලබා ගැනීම.
- අයවැය, වාර්ෂික ගිණුම් සහ ප්‍රගති වාර්තා සකස් කිරීම.
- දෛනික පරිපාලක කටයුතු, පිරිස් පාලනය, නඩත්තු හා සුඛසාධන කටයුතු හා ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල අවශ්‍යතා ඉටු කිරීම.

කාර්යමණ්ඩල ශක්තිමත් කිරීම සහ අභිප්‍රේරණය

2019 වර්ෂය තුළ කාර්ය මණ්ඩල පිරිවැටුම

කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

ආචාර්ය ඒ. විජේසූරිය	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්. සහ තා. සම්.)	12.04.2019
ඒ.එන්.පී. පෙරේරා මිය	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)	17.06.2019
ඒ.ජේ.එම්.සී.එම්. සිරිවර්ධන මහතා	-	පර්යේෂණ නිලධාරී	01.10.2019
ආර්.ඩී.ආර්.ආර්. රණතුංග මෙනවිය	-	පර්යේෂණ නිලධාරී	02.10.2019
ඒ.එන්.එම්.බී.ආර්. ප්‍රභාත් මහතා	-	සංවර්ධන නිලධාරී	04.10.2019

කේ.පී. හර්ෂනී මෙනවිය	-	තාක්ෂණ නිලධාරී	01.10.2019
එම්.ඒ.ටී. කාරිකා මෙනවිය	-	තාක්ෂණ නිලධාරී	01.10.2019
ආර්.කේ.පී.ජේ. ගුණවර්ධන මෙනවිය	-	තාක්ෂණ නිලධාරී	03.10.2019
ජේ. කේ. ඒ. මධුෂානි මෙනවිය	-	කළමනාකරණ සහකාර (ගිණුම්)	01.10.2019
ඩී. එච්. ඩබ්. ලක්මාලි මෙනවිය	-	පොදු කම්කරු	26.08.2019
ඩී. ආර්. පී. බණ්ඩාර මහතා	-	පොදු කම්කරු	26.08.2019
ඩී. එම්. කලපුගේ මහතා	-	පොදු කම්කරු	26.08.2019

විශ්‍රාම යෑම්

ආචාර්ය ඒ.පී. කීර්තිපාල	-	අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී	13.07.2019
එස්.ඩී. සරත් මහතා	-	පොදු කම්කරු (කාර්යාල)	20.02.2019
ඩබ්. සිරිසේන මහතා	-	පොදු කම්කරු	19.01.2019
බී.ජී. සුමනාවති මිය	-	පොදු කම්කරු	09.03.2019
අයි.එම්. සේනාරත්න මහතා	-	පොදු කම්කරු	12.11.2019
ඩබ්ලිව්. සුමනරත්න මහතා	-	පොදු කම්කරු	26.12.2019

ඉල්ලා අස්වීම්

එම්.කේ.ඒ. අංජලා අමාලි මිය (ද්විතීයන පදනම මත)	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)	15.05.2019
ආචාර්ය ඩී. මානෙල්	-	පර්යේෂණ නිලධාරී	25.03.2019
ටී.එම්.එල්.එස්. තෙන්නකෝන් මහතා	-	පොත් තබන්නා	15.10.2019
ඒ.ඩබ්.ඒ.ඩී. සඳරුවනි මිය	-	තාක්ෂණ නිලධාරී	18.01.2019
ඒ.එස්. ජයලත් මහතා	-	පොදු කම්කරු	09.08.2019

කාර්ය මණ්ඩල පුහුණුවීම් (විදේශ)/විදේශ සංචාර

i අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය ඒ.පී. කීර්තිපාල, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඒ.එල්.සී. ද සිල්වා මහතා, සහ පර්යේෂණ නිලධාරීන්වන ඩී.කේ.ඒ.එස්.එම්. වනසිංහ මිය සහ කේ.එම්.ජී.වංචලා මිය ඉන්දියාවේ උක් පර්යේෂණ ආයතනයේ 2019 පෙබරවාරි 16 සිට 19 දක්වා උක් හා ඒකාබද්ධ කර්මාන්තවල තිරසාර සංවර්ධනය සඳහා හරිත තාක්ෂණයන් පිළිබඳ සම්මන්ත්‍රණයකට සහභාගී විය.

ii ජී.එස්.කේ. දහනායක මහතා, වැඩ අධිකාරී ඉන්දියාවේ බැන්ගලෝර් සහ මයිසූර් හි **2019** ජුනි **22-28** දක්වා පවත්වන ලද නිපුණතා සංවර්ධන අරමුදල විසින් සංවිධානය කරන ලද අත්දැකීම් සහ ඉගෙනීමේ ක්‍රමවේදය තුළින් ආයතනික කාර්ය සාධනය පිළිබඳ පුහුණු වැඩසටහනකට සහභාගී විය.

iii සභාපති, කේ.ඒ.එච්. කරුණාසේන මහතා, සහ ආචාර්ය අරුණ විජේසූරිය, වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්. හා තා.ස.) **2019** මැයි **6-9** දක්වා ඉන්දියාවේ වසන්තදා ඕනි ආයතනයේ (වීඑස්අයි) සංචාරය කරන ලදි.

iv පර්යේෂණ නිලධාරීන් වන ඩී.කේ.ඒ.එස්.එම්. වනසිංහ මිය, ඒ.එන්.ඩබ්.සුමේධා තුෂාරි මිය සහ කේ.එම්.ජී.වංචලා මිය **2019** ජූලි **31** සිට **2019** අගෝස්තු **2** දක්වා තායිලන්තයේ පැවති ජාත්‍යන්තර ඕනි සහ උක් සමුළුවට සහභාගී විය.

v ඩී.එම්.ජේ.එන්.දිසානායක මිය, ගණකාධිකාරී **2019** ජූලි **28** සිට **2019** අගෝස්තු **3** දක්වා තායිලන්තයේ නිපුණතා සංවර්ධන අරමුදල් සමාගම විසින් පවත්වන ලද නවෝත්පාදික රාජ්‍ය පරිපාලනය සහ පාලනය පිළිබඳ පුහුණුවට සහභාගී විය.

දිගුකාලීන පුහුණුවීම් (විදේශීය)

i. කේ.ටී.අරියවංශ මහතා පර්යේෂණ නිලධාරී ජපානයේ ෂුකුබා විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධිය සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු වල නිරතවේ.

කාර්ය මණ්ඩල පුහුණුවීම් (දේශීය)

සහභාගී වූ පුහුණු වැඩසටහන් / වැඩමුළු / සම්මන්ත්‍රණ (දේශීය)

- අභ්‍යන්තර විගණක එස්.පී.වයි මුනීන්ද්‍ර මහතා පී.ආර්.ඒ.ජී. ආයතනයේ පුහුණු වැඩසටහනකට සහභාගී විය.
- ඒ.එම්.එම්.එස්. පෙරේරා මිය, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී, වයි.ඒ.පී.කේ. දයාසේන මහතා, පර්යේෂණ නිලධාරී 2019 අප්‍රේල් 1 සිට 5 දක්වා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජෛව තාක්ෂණ මධ්‍යස්ථානයේ පැවති ශාක, සත්ව හා මානව යන දෙඅංශයේම ජාන සංස්කරණය කිරීම තුළින් ශ්‍රී ලංකාවේ අනාගතයක් තිබෙද හා ජාන ප්‍රකාශනය සම්බන්ධ වැඩමුළුවකට සහභාගි විය.
- ඒ.ජී.යූ.එස්. ද සිල්වා, කළමනාකරණ සහකාර (ගිණුම්) බටහිර භාෂා අධ්‍යයන(පුද්) ආයතනයේ ඉංග්‍රීසි පාඨමාලාවකට සහභාගි විය.
- එස්.පී.වයි මුනීන්ද්‍ර මහතා, අභ්‍යන්තර විගණක 2019 මැයි 23 සහ 24 යන දෙදින තුළ නිපුණතා සංවර්ධන අරමුදලේ අභ්‍යන්තර විගණනය පිළිබඳ දෙදින වැඩමුළුවකට සහභාගී විය.
- එම්.එම්.අයි.එම්.එම්.මැණික්කඩවර මෙනවිය, කළමනාකරණ සහකාර (ලිපිකරු සහ යතුරු ලියනය) 2019 මැයි 30 සහ 31 යන දිනවල නිපුණතා සංවර්ධන අරමුදලේ නවීන කාර්යාල පද්ධතිය සහ කාර්යාල කළමනාකරණය පිළිබඳ වැඩමුළුවකට සහභාගී විය.
- ආර්.ජී.එස්. නිරෝෂන මහතා, ගබඩා හාරකරු ටී.එම්.එල්.එස්. තෙන්නකෝන් මහතා, පොත් තබන්නා සහ ඩබ්ලිව්.ඒ.එස්. මධුශංක මහතා, කළමනාකරණ සහකාර(ලිපිකරු සහ යතුරුලියනය) 2019 ජූනි 29 දින සිට නිපුණතා සංවර්ධන අරමුදලේ සීමාසහිත ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මාස හතරක සහනික පාඨමාලාවක් හදාරන ලදී.
- ටී. ආර්. පීරිස් මහතා, කළමනාකරණ සහකාර (ගිණුම්) 2019 ජූනි 23 දින සිට ගබඩා හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනයේ දින 12ක ගබඩා කළමනාකරණ පාඨමාලාව හදාරන ලදී.
- ඩී.එම්.ජේ.එන්. දිසානායාක මිය, ගණකාධිකාරී 2019 මැයි 23 සහ 24 යන දෙදින තුළ නිපුණතා සංවර්ධන අරමුදලේ සීමාසහිත වෘත්තිකයින් සඳහා ව්‍යාපාර ලිවීම පිළිබඳ දෙදින පුහුණු වැඩසටහනකට සහභාගිවන ලදී.
- එස්. එස්. වතුරුනි මිය, කළමනාකරණ සහකාර (ගිණුම්) 2019 ජූලි මස 11 වන දින නිපුණතා සංවර්ධන අරමුදලේ ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳ වැඩමුළුවකට සහභාගී විය.
- පී.ආර්.බී. චන්ද්‍රසේන මහතා, ගොවිපල අධිකාරී සහ ජී.එස්.කේ. දහනායක මහතා. වැඩ අධිකාරී 2019 ජූලි 31 සහ අගෝස්තු 1 යන දිනවල ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානයේ බර යන්ත්‍ර හා ඵලදායිකාව පිළිබඳ පුහුණු වැඩසටහනකට සහභාගී විය.
- විධායක කාර්ය මණ්ඩලය සඳහා නායකත්වය සහ කණ්ඩායම් ක්‍රියාකාරිත්වය පිළිබඳ දෙදින පුහුණු වැඩසටහනක් 2019 අගෝස්තු 6 සහ 7 යන දිනවල උක් පර්යේෂණ ආයතනයේ දී පවත්වන ලදී.
- කේ.එච්.ඩී. අබේරත්න, පර්යේෂණ නිලධාරී 2019 අගෝස්තු 31 වන දින ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානයේ දී විද්‍යාත්මකව හා ආරක්ෂිතව වාහන භාවිතය පිළිබඳ එක්දින වැඩමුළුවකට සහභාගී විය.
- එම්. ඒ. රංජනී සමරසේකර මෙනවිය, කළමනාකරණ සහකාර(ලිපිකරු සහ යතුරුලියනය), 2019 සැප්තැම්බර් 26 වන දින සීමාසහිත ප්‍රාග් සර්විස් (පුද්ගලික) හි කම්කරු කළමනාකරණය - නීතිය සහ රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩසටහනකට සහභාගී විය.
- එම්.ජී.එන්. සෙව්වන්දි මිය, පර්යේෂණ නිලධාරී සහ එම්.ඒ.ආර්.පෙරේරා මිය, තාක්ෂණ නිලධාරීන් 2019.10.22 දින එන්.අයි.බී.එම්. හි පුහුණු වැඩසටහනකට සහභාගී විය.
- පී.එල් 1 සේවකයන් සඳහා වූ ජාතික භාෂා අධ්‍යාපන පුහුණු ආයතනය විසින් ඇඹිලිපිටියේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පවත්වන ලද දෙමළ භාෂා පිළිබඳ වැඩසටහන සඳහා සහභාගී විය.
- ඇඹිලිපිටිය, ඊසොෆ්ට් ආයතනය මඟින් පවත්වන ලද උසස් එක්සෙල් පිළිබඳ පැය 20ක පුහුණුවක් සඳහා නිලධාරීන් 13 දෙනෙකු සහභාගිවිය.
- එම්.ජී.ජී.එන්. සෙව්වන්දි, පර්යේෂණ නිලධාරී සහ එම්.ඒ.ආර්.අයි. පෙරේරා, තාක්ෂණ නිලධාරී යන අය 2019 ඔක්තොම්බර් 25 වන දින බොගවන්තලාව ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ 'ආහාර නිෂ්පාදනය සඳහා ආහාර සුරක්ෂිතතාව' පිළිබඳ පුහුණු වැඩසහනකට සහභාගී වීම.

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව - 2019

2019 වර්ෂයේ විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් වාර **4**ක් පවත්වා ඇත. මෙම වර්ෂයේ දී ද ආයතනයේ පර්යේෂණ කටයුතුවල ප්‍රගතිය මෙන්ම පරිපාලන හා ගිණුම් අංශයේ ප්‍රගතිය සහ ගැටලු පිළිබඳව සාකච්ඡාවට ලක්කරන ලදී.

කමිටු රැස්වීම්වල වාර්තා පාලක මණ්ඩලය වෙත යොමු කිරීමත් එම්දී එම කරුණු තවදුරටත් සාකච්ඡා කිරීම තුළින් ආයතනයේ පරිපාලනමය සහ ගිණුම් අංශයේ කටයුතු බාධාවකින් තොරව කරගෙන යාමට හැකි වීමත් විශේෂයෙන් රජයේ විගණකවරුන් විසින් යොමු කරන ලැබූ විගණන විමසුම් සහ ඒවා සඳහා ලබා දෙන ලද පිළිතුරු සාකච්ඡාවට භාජනය කිරීමත් සහ ඒවා නිවැරදි කිරීමට කටයුතු කිරීම තුළින් විගණන ගැටලු අවම කිරීමට හැකිවී ඇත.

ඊට අමතරව ආයතනයේ ස්ථාපිත කර ඇති අභ්‍යන්තර පාලන පද්ධතීන්ට හා රජයේ චක්‍රලේඛණයන්ට අනුව ආයතනයේ කටයුතු පවත්වා ගෙන යාමටත් පාලක මණ්ඩලයට තීන්දු තීරණ ගැනීම සඳහාත් අවශ්‍ය තොරතුරු ලබාදෙමින් ආයතනීය විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යභාරය අදාළ කාල පරිච්ඡේදය තුළ නොපිරිහෙලා ඉටුකර ඇත.

එස්.පී.වයි. මුනීන්ද්‍ර
අභ්‍යන්තර විගණක

2020 මාර්තු **01** දින

විගණනය කරන ලද
මූල්‍ය ප්‍රකාශන

උක් පර්යේෂණ ආයතනය

2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

	සටහන්	2019 (රු)	2018 (රු)
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත හා උපකරණ	1	258,116,964.06	264,315,934.90
	-	258,116,964.06	264,315,934.90
ජංගම වත්කම්			
පාරිභෝගික තොගය	-	28,387,753.73	20,390,660.46
ජීව විද්‍යාත්මක තොගය	-	-	-
නයවර ලිපි සඳහා අත්තිකාරම්	-	-	-
නොනිමි වැඩ	-	-	-
වෙළඳ හා අනෙකුත් ලැබියයුතු දෑ	2	51,441,293.06	50,175,436.54
ආයෝජන (කෙටිකාලීන)	3	73,155,188.12	124,055,689.47
කලින් ගෙවීම් සහ වෙනත් තැන්පතු	4	1,083,900.74	1,083,900.74
මුදල් හා මුදල් සමාන දෑ	5	16,752,596.05	7,662,481.69
	-	170,820,731.70	203,368,168.90
මුළු වත්කම්	-	428,937,695.76	467,684,103.80
		==========	==========
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු වියදම්	6	9,268,482.99	6,053,385.07
උපචිත වියදම්	7	7,777,249.62	7,936,706.79
අත්හිටුවීම්	-	-	-393.46
ණයගිම් පාලන ගිණුම	-	-	-
	-	17,045,732.61	13,989,698.40
ජංගම නොවන වගකීම්			
	-	-	-
විලම්බිත ආදායම්			
වෛද්‍යාධාර සඳහා වෙන් කිරීම්(උප ලේඛණ 9)	-	6,067,490.00	5,709,736.90
විගණන ගාස්තු සඳහා වෙන්කිරීම්	-	850,000.00	750,000.00
පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම් (උප ලේඛණ 10)	8	77,449,015.50	69,633,685.00
අඩමාන ණය සඳහා වෙන්කිරීම්	-	489,066.77	227,888.72
අසම්භාව්‍ය වගකීම් සඳහා වෙන්කිරීම්	-	-	850,000.00
	-	84,855,572.27	77,171,310.62
මුළු වගකීම්	-	101,901,304.88	91,161,009.02
		==========	==========
මුළු ශුද්ධ වත්කම්	-	327,036,390.88	376,523,094.78
ශුද්ධ ලාභය/ (හිගය)	-	-41,630,865.10	-
සංචිත සමුච්චිත අරමුදල්	-	233,338,146.67	241,193,985.47
ප්‍රත්‍යාගත සංචිත	-	135,329,109.31	135,329,109.31
මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය	-	327,036,390.88	376,523,094.78

මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් ලෙස ඉදිරිපත් කිරීම ආයතනය සතු කාර්යභාරයක් මෙන්ම අන්තර්ගත තොරතුරුවල වගකීම ද ආයතනය සතු වේ. ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පිටු අංක 2 සිට 5 දක්වා සහ සටහන් පිටු අංක 12 සිට 15 දක්වා මූල්‍ය ප්‍රකාශණ වල කොටසක් ලෙස ඉදිරිපත් කිරීම පාලක මණ්ඩලය සතු වගකීමකි. මෙම මූල්‍ය ප්‍රකාශණ පාලක මණ්ඩලය විසින් අනුමතකොට ඇති අතර, ඔවුන් වෙනුවෙන් අත්සන් කරමි.

ආචාර්ය. අරුණ විජේසූරිය
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී

ඩී. එම්. ජේ. එන්. දිසානායක
ගණකාධිකාරී

ආචාර්ය. නිමල් කුමාරසිංහ
සභාපති පාලක මණ්ඩලය

සුරේකා එන් අත්තනායක
සාමාජික- පාලක මණ්ඩලය

උක් පර්යේෂණ ආයතනය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍යමය කාර්යසාධන ප්‍රකාශණය

	සටහන්	2019	2018
මෙහෙයුම් ආදායම්			
සීනි ආනයනය මත සෙස්			
